# ඉතිහාසය

# 7

## ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ)

# ශ්‍රේණිය



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශය

# 7 වන ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk    විද්‍යුත් තැපැල : info@nie.lk

ඉතිහාසය
7 වන ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ..............

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත්වන සහ එකොළොස්වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | |
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| **විෂය විශේෂඥ සභය** | |
| මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ | කොළඹ විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය රාජ් සෝමදේව | කැලණිය විශ්ව විද්‍යාලය (පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය) |
| මහාචාර්ය පත්මසිරි කන්නන්ගර | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| ආචාර්ය රෝහිත දසනායක | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| **ලේඛක මණ්ඩලය (බාහිර)** | |
| කේ.එස්. රංජනී | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ |
| ඩබ්ලිව්.ඒ. පියසීලි | ගුරු සේවය<br>ශ්‍රී රාහුල මධ්‍ය මහා විද්‍යාලය, අලව්ව |
| එච්.එම්. නලින් බණ්ඩාර | ගුරු සේවය<br>කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය, කුරුවිට |
| මේරි ඩොනේටා කන්‍යාසොයුරිය | විදුහල්පති (විශ්‍රාමික)<br>ශාන්ත අන්තෝනි ජාතික පාසල, වත්තල |
| එම්.එච්.එම්.යාකුත් | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| සී.එස්.කුමරප්පෙරුම | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර |
| **ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)** | |
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| ඩබ්ලිව්.එස්.එස්. ගුණවර්ධන | සහකාර කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| **භාෂා සංස්කරණය** | නියෝජ්‍ය විදුහල්පති (විශ්‍රාමික)<br>ඩබ්.ඩී.කේ.ඩී.පිරිගල |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට පාසල් විෂය මාලාවේ හර විෂයක් ලෙස ක්‍රියාත්මක වූ ඉතිහාසය 2015 වර්ෂයේ සිට එලෙස ම ක්‍රියාත්මක වන අතර 6 - 9 ශ්‍රේණි සඳහා සතියකට කාල පරිච්ඡේද දෙකක් හා 10 - 11 ශ්‍රේණි සඳහා සතියකට කාලපරිච්ඡේද තුනක් වෙන්කර ඇත.

අ.පො.ස.(සා.පෙළ) විභාගයට 10 - 11 ශ්‍රේණි සඳහා නියමිත විෂය නිර්දේශ පදනම් කරගෙන ඇගයීම සිදු කිරීමට යෝජිතය.

6 - 11 ශ්‍රේණි සඳහා නිපුණතා පාදක ප්‍රවේශයට ප්‍රධාන නිපුණතා විස්සක් යටතේ ඉතිහාසය විෂයමාලාව ගොඩනගා ඇත. එම විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට සකසා ඇති මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශය හා විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මගපෙන්වීම යන කොටස් දෙකකින් සමන්විත ය.

ඉතිහාසය විෂය තුළින් සිසුන් තුළ ප්‍රගුණ කිරීමට අපේක්ෂිත නිපුණතා සංවර්ධනය කිරීමේ දී විෂය කරුණු මෙන් ම විෂය කරුණු අධ්‍යයනය කිරීමට යොදාගන්නා ක්‍රමවේදයන් ද වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගුරු කාර්ය පහසු කර ගැනීම සඳහා විෂය අන්තර්ගතයෙහි ඇතැම් කොටස් ආවරණය වන පරිදි නිදර්ශක ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් කර ඇත. ඔබගේ නිර්මාණශීලී හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් පන්ති කාමර අවශ්‍යතාවන් අනුව මෙම ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කිරීම හා නව ක්‍රියාකාරකම් සැකසීමට හැකිය. මෙහි දී සැළකිලිමත් විය යුත්තේ ඉතිහාසය විෂයේ අරමුණු ඉටුවන පරිදි අවම වශයෙන් 50%ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරමින් නියමිත විෂය කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කිරීමයි.

ඒ අනුව ඉතිහාසය විෂයේ අරමුණු ඉටුකරමින් නිපුණතා සපිරි නව ලොවකට උචිත සිසු පිරිසක් බිහිකිරීමට අත්වැලක් සැපයීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් ඔබගේ සංවර්ධනාත්මක අදහස් හා යෝජනා අපවෙත යොමුකරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

**විෂයමාලා කමිටුව**

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vi |
| විෂය නිර්දේශය අන්තර්ගතය | viii-xx |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01 - 43 |
| 7.1 අපේ පැරණි ජන ජීවිතය | 01 - 09 |
| 7.2 අපේ කීර්තිමත් රජවරු - 2 | 10 - 23 |
| 7.3 අපේ සංස්කෘතික උරුමය | 24 - 32 |
| 7.4 පසුකාලීන පාලන මධ්‍යස්ථාන | 33 - 36 |
| 7.5 යුරෝපයේ පැරණි ශිෂ්ටාචාර - 2 | 37 - 43 |


-

# ඉතිහාසය

## විෂය නිර්දේශය

## 7 ශ්‍රේණිය

**(2016 සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

## හැඳින්වීම

තම රටේ අනන්‍යතාව හඳුනාගනිමින් , ඒවා රැකගනිමින් ලෝක තත්ත්වයන්ට මුහුණ දිය හැකි දැහිතකාමී, ශක්තිමත් ශ්‍රී ලාංකික පුරවැසියකු බිහිකර ගැනීමේ අරමුණු පෙරදැරි කර ගෙන පාසල් විෂයමාලාවේ හර විෂයක් ලෙස ඉතිහාසය විෂය 2007 වසරේ සිට ක්‍රියාත්මක වේ.

මෙම අරමුණු වඩාත් පෝෂණය කරමින් 2015 දී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ජාතික පොදු අරමුණු සහ ජාතික පොදු නිපුණතා ද පාදක කර ගනිමින් ඉතිහාසය විෂයට අදාළ ව නිපුණතා විසිතුනක් යටතේ 6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ඉතිහාසය විෂයමාලාව නිපුණතා පාදක ක්‍රමවේදය යටතේ සකස් කර ඇත.

7 වන ශ්‍රේණිය සඳහා වූ මෙම විෂය නිර්දේශය එහි ප්‍රතිඵලයකි. 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වීමට නියමිත මෙහි නිපුණතා පහක් යටතේ විෂය අන්තර්ගතය ගොඩනගා ඇත. අපේ පැරණි ජන ජීවිතය, අපේ කීර්තිමත් රජවරු, අපේ සංස්කෘතික උරුමය, පසුකාලීන රාජධානි හා පැරණි ශිෂ්ටාචාර ආදී වශයෙන් දේශීයත්වය පිළිබිඹු වන තේමා පහක් හා පැරණි ලෝකය පිළිබඳ ව අධ්‍යයනයට යොමු කර ඇත.

ඇ·

.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

I වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

[illegible]. තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා :
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(iii) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම

ඉ: යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# ඉතිහාසය විෂයයේ අරමුණු

6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා වූ විෂයමාලාව අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කර ගනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

1. ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම
2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය තුළින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමයන් සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම
4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම
5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිම
6. කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම
7. වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම
8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීම

xiv

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| අතීත අත්දැකීම් ඇසුරින් වර්තමානයට ආදර්ශ ගනියි | 1.1 පැරණි ආර්ථික හා සමාජ රටාව ඇසුරින් දේශීයත්වය මතුකර දක්වයි | **1. අපේ පැරණි ජන ජීවිතය**<br>1.1 ආර්ථිකය<br>• කෘෂිකාර්මාන්ත<br>• කර්මාන්ත<br>• වෙළෙඳාම<br>1.2 සමාජය<br>• සංස්කෘතිය<br>- විවාහය<br>- අවමංගල්‍ය සිරිත් විරිත් සහ සාරධර්ම | • පැරණි කාලයේ යැපීම් ක්‍රම විස්තර කරයි<br>• පැරණි කාලයේ ශිල්ප තාක්‍ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි<br>• පැරණි කාලයේ වෙළෙඳාම පැවති ආකාරය විස්තර කරයි<br>• පැරණි කාලයේ පැවති සමාජ ජීවිතය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි | 10 |
| අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසා බලයි | 2.1 මානවම්ම රජපෙළපතේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දෙයි | **2. අපේ කීර්මත් රජවරු 02**<br>**2.1** මානවම්ම රජ පෙළපත<br>2.1.1 ආරම්භය<br>2.1.2 රාජ්‍ය පාලන සංවිධානය හා එහි ක්‍රියාකාරිත්වය<br>2.1.3 රාජ්‍ය ප්‍රතිපත්ති සහ සමාජ සුබසාධනය | • මානවම්ම පෙළපතේ රජවරු පිළිබඳ විස්තර කරයි<br>• මානවම්ම පෙළපතේ රජවරුන්ගේ පාලන ප්‍රතිපත්ති පැහැදිලි කරයි<br>• මානවම්ම පෙළපතේ රජවරුන්ගේ සමාජ සුබසාධන කටයුතු පැහැදිලි කරයි | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| කලාපීය වශයෙන් උද්ගතවන දේශපාලන අර්බුද කළමනාකරණය සඳහා දේශීය පාලකයින් ක්‍රියාකළ ආකාරය විමසා බලයි | **2.2.1අතීත පාලකයෝ දේශයේ ස්වාධීනත්වය ආරක්ෂා කරගැනීම සඳහා ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරයි** | 2.1.4 කලාපීය දේශපාලනික හා සමාජ ප්‍රවණතා<br><br>**2.2 විජයබාහු රජතුමා**<br>2.2.1 ළමා කාලය<br>• රාජ්‍ය බලය ලබා ගැනීම<br>2.2.2 විජයබාහු රජතුමාගේ දේශපාලන ක්‍රියාකාරිත්වය<br>• සටන් ව්‍යාපාර හා එහි පසුබිම<br>• විදේශ ප්‍රතිපත්තිය<br>2.2.3 විජයබාහු රජතුමාගේ සමාජ මෙහෙවර<br>• ආගමික කටයුතු<br>• විජයබාහු රජතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ | • මානවම්ම පෙළපතේ රජවරුන්ගේ විදේශ කටයුතු විස්තර කරයි<br>• මානවම්ම පෙළපතේ රජවරුන්ගෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි<br><br>• පාලකයින් අප්‍රතිහත ධෛර්යයෙන් සිය අරමුණුවලට ළඟාවන ආකාරය විස්තර කරයි<br>• සමාජ ප්‍රගමනය උදෙසා පාලකයින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පැහැදිලි කරයි<br>• ඉවසීම,තීක්ෂණ ඥානය, පුළුල් දැක්ම හා සංවිධාන ශක්තිය යන ගුණාංග නායකයකුගේ චරිතයෙන් පිළිබිඹුවන ආකාරය පෙන්වා දෙයි පෙන්වා දෙයි | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ විමසා බලයි | **2.3.1 මහා පරාක්‍රමබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය මතුකර දක්වයි** | **2.3 මහා පරාක්‍රමබාහු රජතුමා**<br>2.3.1 පරපුර හා රාජකීය සබඳතා<br>2.3.2 බලය සඳහා කළ අරගල<br>2.3.3 ආර්ථික සංවර්ධනය<br>• ප්‍රධාන වාරි ව්‍යාපෘති<br>• ශාසන සාමග්‍රිය ඇති කිරීම | • පරාක්‍රමබාහු රජතුමාගේ පෞරුෂය ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙයි<br>• පරාක්‍රමබාහු රජතුමාගේ පාලන ප්‍රතිපත්ති සමාජය නගාසිටුවීමට පසුබිම් වූ ආකාරය පැහැදිලි කරයි | 05 |
| | **2.3.2 ස්වදේශික පාලකයින් සිය අසල්වැසි රටවල් සමඟ කටයුතු කළ ආකාරය පෙන්වා දෙයි** | 2.3.4 විදේශ ප්‍රතිපත්තිය<br>• දකුණු ඉන්දීය සටන් ව්‍යාපාර<br>• අග්නිදිග ආසියාව සමඟ කළ ගනුදෙනු | • පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තිය හා එහි බලපෑම් විස්තර කරයි | |
| | **2.4 නිශ්ශංකමල්ල රජතුමාගේ කාර්යසාපල්‍ය පැහැදිලි කරයි** | **2.4 නිශ්ශංකමල්ල රජතුමා**<br>• පරපුර හා අනන්‍යතාව<br>• දේශපාලනික ක්‍රියාකාරිත්වය හා සමාජ සුබසාධනය | • පාලකයින්ගේ අනන්‍යතාව තුළ තිබෙන සුවිශේෂීතාව විස්තර කරයි<br>• නිශ්ශංකමල්ල රජතුමා මුහුණදුන් අභියෝග ජයගත් ආකාරය මතුකර දක්වයි<br>• නිශ්ශංකමල්ල චරිතයෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ ඉතිහාසයෙන් පිළිබිඹු වන සංස්කෘතික දායාද දේශිය හා ලෝක උරුම ලෙස අගය කරමින් එම දායාද සුරකියි | **3.1 අපේ සංස්කෘතික උරුමය පැහැදිලි කරයි** | **3. අපේ සංස්කෘතික උරුමය**<br>3.1 අපේ සංස්කෘතික උරුමය හඳුන්වාදීම<br>3.1.1 ස්පෘෂ්‍ය උරුමය<br>• ස්පෘෂ්‍ය උරුමය හැඳින්වීම<br>• ලෝක උරුමයක් වූ සීගිරිය | • සංස්කෘතික උරුමය පැහැදිලි කරයි<br>• ස්පෘෂ්‍ය උරුමය විස්තර කරයි<br>• ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුම නම් කරයි<br>• ලෝක උරුමයක් වූ සීගිරිය පිළිබඳ විස්තර කරයි | 10 |
| | | 3.1.2 අස්පෘෂ්‍ය උරුමය<br>• අස්පෘෂ්‍ය උරුමය හැඳින්වීම | • අස්පෘෂ්‍ය උරුමය පැහැදිලි කරයි | |
| | **3.2 අපේ සංස්කෘතික උරුමය ආරක්ෂා කළ යුතු බව පෙන්වා දෙයි** | 3.2 අපේ සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම | • ඉපැරණි ඉතිහාසයක් ඇති රටක් ලෙස අපට ජාතික උරුම රැසක් ඇති බව පෙන්වා දෙයි<br>• ජාතික උරුමය ආරක්ෂා කළ යුතු බව පැහැදිලි කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ඉන්දීය සාගර කලාපයේ සමාජ, ආර්ථික ප්‍රවණතාවල පරිවර්තනයට සමගාමී ව ශ්‍රී ලංකාවේ සභ්‍යත්වය ඊට අනුකූලනය වූ ආකාරය විමසා බලයි | **4.1 පසුකාලීන පාලන මධ්‍යස්ථානවල තොරතුරු ඉදිරිපත් කරයි** | **4. පසුකාලීන පාලන මධ්‍යස්ථාන**<br>• දඹදෙණිය<br>• යාපහුව<br>• කුරුණෑගල<br>• ගම්පොළ<br>• කෝට්ටේ<br>• යාපනය | • පසුකාලීන පාලන මධ්‍යස්ථාන හඳුන්වයි<br>• පාලන මධ්‍යස්ථාන වෙනස් වීමට හේතු දක්වයි<br>• පාලන මධ්‍යස්ථානවල ශ්‍රේෂ්ඨ පාලකයින් පිළිබඳ විස්තර කරයි | 10 |
| මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි | **5.1 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර පැහැදිලි කරයි** | **5 .ලෝකයේ පැරණි ශිෂ්ටාචාර2**<br>5.1 යුරෝපයේ පැරණි ශිෂ්ටාචාර<br>• ග්‍රීසිය<br><br>• රෝමය | • ග්‍රීක ශිෂ්ටාචාරයේ පිහිටීම හඳුනා ගනියි<br>• ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි<br>• ග්‍රීක ශිෂ්ටාචාරයේ ස්වරූපය පැහැදිලි කරයි<br>• ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වු දායාද විස්තර කරයි<br><br>• රෝම ශිෂ්ටාචාරයේ පිහිටීම හඳුනා ගනියි<br>• පැරණි රෝම සභ්‍යත්වය පැහැදිලි කරයි<br>• රෝම ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වු දායාද විස්තර කරයි | 08 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 7.1 අපේ පැරණි ජන ජීවිතය

ශ්‍රී ලාංකේය අතීත ජනයා විවිධ අභියෝගවලට මුහුණදෙමින් සිය අනන්‍යතාව ගොඩනගා ගැනීමට සමත් වූහ. එම අනන්‍යතාව ගොඩනගාගත් ආකාරය හා එය විද්‍යමානවන ක්ෂේත්‍ර පිළිබඳ ව හැදෑරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ. අතීත සමාජයේ පැවති අනන්‍යතව හා උරුමය පිළිබඳ සංවේදී පුරවැසියකු නිර්මාණය කිරීමටත් එම ආදර්ශ වර්තමාන ජන ජීවිතයට ආදේශකර ගතහැකි ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාදීමත් මෙම ඒකකයෙන් අපේක්ෂා වේ.

**නිපුණතාව** • අතීත අත්දැකීම් ඇසුරින් වර්තමානයට ආදර්ශ ගනියි

**නිපුණතා මට්ටම** 1.1 පැරණි ආර්ථික හා සමාජ රටාව ඇසුරින් දේශීයත්වය මතුකර දක්වයි
**කාලච්ඡේද සංඛ්‍යාව:** 03
**ඉගෙනුම් පල** • පැරණි කාලයේ යැපීම් ක්‍රම පිළිබඳ විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

7.1 **අපේ පැරණි ජන ජීවිතය**

1.1 ආර්ථිකය

- ශ්‍රී ලාංකේය පැරණි ජන සමාජයේ ආර්ථික රටාව කෘෂිකාර්මාන්තය, කර්මාන්තය හා වෙළෙඳාම යන ක්ෂේත්‍රවලින් සමන්විත වීම
- කෘෂිකාර්මාන්තය
  - කෘෂිකාර්මාන්තය හේන් වගාව, මඩ ගොවිතැන, සත්ව පාලනය යටතේ විස්තර කිරීම
    - හේන් වගාව
      - හේනක් යනු කුමක් දැයි පැහැදිලි කිරීම
      - හේන් වගාවට වර්ෂා ජලය උපයෝගිකර ගැනිම
      - හේනක් සකස් කරගන්නා ආකාරය පහත සඳහන් කරුණු යටතේ විස්තර කිරිම
        - ★ හේන සඳහා සුදුසු බිම් ප්‍රදේශයක් තෝරා ගැනීම
        - ★ තෝරාගත් බිමෙහි වල් කොටා එළිපෙහෙළි කිරීමට ප්‍රථම එහි ජීවත්වන සතුන් පළවා හැරීම
        - ★ අතීත ජනතාව සත්ත්ව හිංසනය පිටුදැකිම හා සතුන්ට ජීවත්වීමේ අයිතිය තහවුරු කළ ආකාරය සිසුන්ට පැහැදිලි කිරිම
        - ★ වෙන්කරගත් කැළෑ බිම එළිපෙහෙළිකර ගිනි තැබීම
        - ★ කපා දමනලද දැව දඬු භාවිත කරමින් හේන් බිම වටා දඬුවැටක් නිර්මාණය කිරීම

★ සකස් කරනලද බිමෙහි විවිධ භෝග වගා කිරීම
(මිනේරි, කුරක්කන්, ඇල්වී විවිධ ධාන්‍ය, විවිධ අල වර්ග)

★ අස්වැන්න නෙළාගත් පසු හේන අතහැර දැමීම

★ විවිධ ගොවි උපකරණ භාවිත කිරීම

★ හේන් ගොවිතැනට සුවිශේෂ වු වචන

හේනක පින්තූරයක්



- **මඩ ගොවිතැන**
    - මඩ ගොවිතැන පහත සඳහන් කරුණු යටතේ විස්තර කිරීම
        - ⋆ ජලය සම්පාදනය කර ගැනීමෙන් වගා කිරීම
        - ⋆ ජලය එක් රැස්කිරීමට වැව් අමුණු නිර්මාණය කිරීම
        - ⋆ ප්‍රධාන වශයෙන් කන්න දෙකක් වගා කිරීම
            - I. මහ කන්නය
            - II. යල කන්නය
        - ⋆ අස්වැන්නෙන් කොටසක්  ජල පරිභෝජනය සඳහා බදු ගෙවීම
        - ⋆ ගොවීන් ජීවත් වූ ගම් " කසීකාර ගම්" ලෙස හැඳින්වීම
        - ⋆ මඩ ගොවිතැන හා සම්බන්ධ සුවිශේෂී වචන
        - ⋆ වී වගාව සඳහා ලියදි සකස් කරන ආකාරය විස්තර කිරීම
        - ⋆ විවිධ ගොවි උපකරණ භාවිත කිරීම
        - ⋆ අස්වැන්න නෙළීම, ආරක්‍ෂා කරගැනීම හා ක්‍රමානුකූල පරිභෝජනය

- **සත්ත්ව පාලනය**
    - සතුන් ඇතිකරන ලද්දේ
        - ⋆ කිරි හා පෝෂණය සඳහා
        - ⋆ ගොවිතැන සඳහා
        - ⋆ ප්‍රවාහනය සඳහා
        - ⋆ යුධ කටයුතු ආදිය සඳහා
    - ඇතිකරනලද  සතුන් හඳුන්වා දීම (ගවයා, කකුළන්, එළුවන්)
    - මේ අතරින් ගවයා ප්‍රධාන වීම (පස්ගෝරස ලබාගැනීමට)
- පැරණි කෘෂිකර්මාන්තය ඇසුරින් වර්තමානයට ගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න

**ඉහත සඳහන් කරුණු ආවරණයවන පරිදි කෘෂිකර්මාන්තය පිළිබඳ සංකල්ප සිතියමක් සකස්කිරීමට සිසුන් යොමු කරන්න**


- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- පන්තිය කණ්ඩායම් තුනකට බෙදන්න (ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිනම් සංකල්ප සිතියම් දෙකක් සකස් කරවන්න)
- ඇමුණුම 04 හි ඇතුලත් සංකල්ප සිතියම පන්තියට ප්‍රදර්ශනය කරන්න
- ඇමුණුම 01, 02, 03 කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට බෙදා දෙන්න
- එක් එක් කණ්ඩායමට තමන්ට අදාළ කොටස පෙළපොත ඇසුරින් සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න
- කණ්ඩායමේ චිත්‍ර ඇඳීමට දක්ෂ සිසුවකු මගින් අදාළ පින්තූර සකස් කර ගැනීමට උපදෙස් දෙන්න
- ක්‍රියාකාරකම සඳහා කාලපරිච්ඡේද දෙකක් ලබා දෙන්න
- සම්පූර්ණ කරනලද ආකෘති පන්තියට ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව දෙන්න
- සම්පූර්ණ කරනලද ආකෘති කොටස් එකතුකර ඇමුණුම අංක 04 ආකාරයට සංකල්ප සිතියම ගොඩනගා ප්‍රදර්ශනය කරන්න

**ගුණාත්මක යෙදවුම්**

- පාට පැන්සල්, ෆෙල්ට් පෑන්
- ඇමුණුම් 01, 02, 03 කාර්ය පත්‍රිකා
- ඇමුණුම 04 සංකල්ප සිතියම


ඇමුණුම 01

හේන් වගාව ඇසුරෙන් පහත ආකෘතිය සම්පූර්ණ කරන්න




ඇමුණුම 02


මඩ ගොවිතැන ඇසුරෙන් පහත ආකෘතිය සම්පූර්ණ කරන්න



ඇමුණුම 03

සත්ත්ව පාලනය ඇසුරෙන් පහත දැක්වෙන ආකෘතිය සම්පූර්ණ කරන්න




අනුරාධපුර යුගයේ කෘෂිකර්මාන්තය
වාරි ගොවිතැන
ගොඩ ගොවිතැන
සත්ව පාලනය
විශේෂ ලක්ෂණ
නිෂ්පාදන
භාවිත කළ උපකරණ
පින්තූර

**මූලික වදන් / සංකල්ප**

- පස්ගෝරස
- ලියදි

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- පැරණි කෘෂිකර්මාන්තය පිළිබඳ විශේෂ ලක්ෂණ විස්තර කරයි
- අතීත ජනයා පරිසරය සුරකිමින් තම අවශ්‍යතා ඉටුකරගත් ආකාරය අගය කරයි
- සංකල්ප සිතියම සම්පූර්ණ කරයි
- ක්‍රියාකාරකම නිර්මාණශීලී ව ගොඩනැගීමට දායක වෙයි
- නියමිත කාලයට නිම කරයි

**නිපුණතා මට්ටම** 1.1 පැරණි ආර්ථික හා සමාජ රටාව ඇසුරින් දේශීයත්වය මතුකර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ** 01

**ඉගෙනුම් පල**
- පැරණි කාලයේ ශිල්ප තාක්ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

1.1 **ආර්ථිකය**

- **කර්මාන්ත**
  - අතීත සමාජයේ කර්මාන්ත පැවති බව හා ඒවාට උදාහරණ ඉදිරිපත් කිරීම (මැටි, උළු, ගඩොල් , උක්, ලෝහ, කපු)
  - විවධ කර්මාන්ත සම්බන්ධ ශිල්ප ප්‍රාගුණ්‍යතාව පැවතීම (කුඹල්ලු, ලෝකුරුවන්, මණිකාරයන්, කබර)
  - කර්මාන්ත පිළිබඳ තොරතුරු ඇතුලත් ජනප්‍රවාද (කුවේණිය කපු කටිමින් සිටි කතා පුවත)
  - කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වා දීම
  - කලාකරුවාගේ ශිල්පීය දක්‍ෂතාව විවිධ නිර්මාණ ඇසුරින් පෙන්වා දීම
  - නිෂ්පාදන සඳහා භාවිත කරනලද උපකරණ හඳුන්වා දීම (සකපෝරුව, මයිනහම, යකඩ උදුන්, කෝව)
  - ලෝහ කරුමාන්තය ආශ්‍රිත ව කර්මාන්ත රැසක් පැවතීම
  - රට අභ්‍යන්තරයේ ගොඩබිම් හා ජල මාර්ග ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනය සිදු කිරීම

**ඉහත සඳහන් කරුණු ආවරණයවන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

- ඇමුණුම 01 හි සටහන හුණුපුවරුවේ සටහන් කරන්න
- පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ඇමුණුම 02 හි වචන තුණ්ඩුවල ලියන්න
- එම තුණ්ඩු පන්තියේ සියලු දෙනාට ම බෙදාදෙන්න
- තමන්ට ලැබුණු තුණ්ඩුවෙහි වචනය හුණුපුවරුවේ සටහනට ගැළපෙන ස්ථානයෙහි ලිවීමට උපදෙස් දෙන්න
- ඒ අනුව පැරණි කර්මාන්ත, ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඒ සඳහා භාවිත කළ උපකරණ හා ඊට අදාළ ශිල්පීන් පිළිබඳ හඳුනාගැනීමට සලස්වන්න

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01
- ඇමුණුම් 02

ඇමුණුම 01

**අතීත ශ්‍රී ලංකාවේ කර්මාන්ත**

| කර්මාන්ත | නිෂ්පාදන | භාවිත උපකරණ | ශිල්පීන් |
| --- | --- | --- | --- |
| | | | |

ඇමුණුම 02

| | | | |
| --- | --- | --- | --- |
| මැටිකර්මාන්තය | වළං | සකපෝරුව | කබර |
| කපු | ගඩොල් | මයිනහම | තඹකර |
| උක් | රෙදි | ලෝහ උදුන් | මණිකාර |
| ලෝහ | පැණි | කෝව | කුඹල්ලු |
| මැණික් | හකුරු | | |
| | ආභරණ | | |
| | ගොවි උපකරණ | | |
| | ආයුධ | | |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- කර්මාන්ත හා සම්බන්ධ නම් පෙන්වා දෙයි
- කර්මාන්ත පිළිබඳ වගුව සම්පූර්ණ කිරීමට දායක වෙයි
- පැරණි කාලයේ පැවති කර්මාන්ත අගය කරයි
- දී ඇති වචන නියමිත ස්ථානයේ සටහන් කරයි
- ක්‍රියාශීලී ව කටයුතු කරයි

**නිපුණතා මට්ටම** 1.1 පැරණි ආර්ථික හා සමාජ රටාව ඇසුරින් දේශීයත්වය මතුකර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 02

**ඉගෙනුම් පල** • පැරණි කාලයේ වෙළෙඳාම පැවති ආකාරය විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න

1.1 **ආර්ථිකය**

- **වෙළෙඳාම**
  - අතීත ශ්‍රී ලංකාවේ වෙළෙඳාම පිළිබඳ විස්තර කිරීම
  - වෙළෙඳාම ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් යටතේ සිදුවීම
    - අභ්‍යන්තර වෙළෙඳාම
    - බාහිර වෙළෙඳාම
  - අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම හඳුන්වා දීම
  - එක් එක් ක්ෂේත්‍ර යටතේ වෙළෙඳාමේ ස්වභාවය පැහැදිලි කිරීම
    - භාණ්ඩ හුවමාරුව
    - කාසි භාවිතය
  - වෙළෙඳාම සම්බන්ධ වෙළෙඳ නගර පැවතීම හා ඒවා " නිගම " යනුවෙන් හැඳින්වීම
  - වෙළෙඳ කටයුතු සිදුකළ වරාය ආශ්‍රිත වෙළෙඳ ගම් පැවතීම " පට්ටන ගම් / පටුන් ගම් "
  - වෙළෙඳ කටයුතු නියැලුණු පිරිස් අයත් වූ වෙළෙඳ ශ්‍රේණි පැවතීම (වලංජියාර්, නානාදේසීන්, අඤ්ජුවණ්ණම්)
  - වෙළෙඳාමේ දි සිදුකළ වංචනික ක්‍රියා වැළැක්වීමට, වෙළෙඳාම සංවිධානාත්මක ව සිදුකිරීම හා පාරිභෝගිකයාට සහන සැලසෙන පරිදි වෙළෙඳාම පාලනය කිරීම සඳහා නීති රීති ක්‍රියාත්මක කිරීම
    උදා: හෝපිටිගම ටැම් ලිපිය

- **බාහිර වෙළෙඳාම**
  - අතීතයේ සිට ශ්‍රී ලංකාව විවිධ රටවල සමග වෙළෙඳ සබඳතා පැවැත්වීම (ඉන්දියාව, චීනය, රෝමය, පර්සියාව, අරාබිය, අග්නිදිග ආසියාව)
  - ලංකාව සතුව ස්වභාවික සම්පත් බහුල වීම
    (කුළු බඩු, මුතු මැණික්, ඇත් දත්, ඖෂධ වර්ග, පිරිසිදු පානීය ජලය, නාවික ආම්පන්න සඳහා වූ දැව)
  - ශ්‍රී ලංකාව සතු අන්තර්ජාතික වෙළෙඳ තොටුපළවල හා වරායන් පැවතීම
    මන්නාරම- (මාතොට), ත්‍රිකුණාමලය- (ගෝකණ්ණ), ගොඩවාය-(ගොඩපවත)
  - විවිධ රටවල් සමග සබඳතා පැවැත්වූ බවට පුරාවිද්‍යා කැනීම් මගින් ගවේෂණය කර අනාවරණය කර තිබීම (චීන මැටි බඳුන්, රෝම කාසි, කානීලියන් පබළු )
- විවිධ රටවලින් පැමිණෙන නැව්වලින් බදු අය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- පැරණි වරායන් හා වෙළෙඳ නගර දැක්වෙන සිතියමක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

විෂය කරුණු හා ඉගෙනුම් පල මැනෙන සේ ඇගයීම් හා තක්සේරු නිර්ණායක සකස්කර ගන්න

**නිපුණතා මට්ටම** 1.1 පැරණි ආර්ථික හා සමාජ රටාව ඇසුරින් දේශීයත්වය මතුකර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 04

**ඉගෙනුම් පල**

- පැරණි කාලයේ පැවති සෞන්දර්යාත්මක වින්දනය, විශ්වාස හා සමාජ ජීවිතය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි
- පැරණි කාලයේ ආර්ථික හා සමාජ තොරතුරු ඇසුරෙන් වර්තමානයට ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

1.2 සමාජය

- සංස්කෘතිය
  - සංස්කෘතිය යනු කුමක්දැයි පැහැදිලි කිරීම
  - අතීත ජනයා අන්‍යොන්‍ය සහයෝගයෙන් ක්‍රියා කළ ආකාරය උදාහරණ මගින් පැහැදිලි කිරීම
    - අත්තම් ක්‍රමය
    - මඟුල් / අවමඟුල්
    - සිරිත් විරිත්,සාරධර්ම

**ඉහත සඳහන් කරුණු ආවරණයවන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- ඇමුණුම 01 හි කාර්ය පත්‍රිකාව කණ්ඩායම්වලට බෙදා දෙන්න
- එම කාර්ය පත්‍රිකාවට අදාළ රචනාවක් ලිවීමට උපදෙස් දෙන්න
- සිසු පිළිතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- මේ සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01 කාර්ය පත්‍රිකාව

ඇමුණුම 01

- අතීත සමාජයෙන් වර්තමාන සමාජයට ගත හැකි ආදරශ මාතෘකාව යටතේ රචනාවක් ලියන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සකස්කර ගන්න

- අතීත සමාජය පිළිබඳ නිවැරදි කරුණු ඉදිරිපත් කරයි
- අතීත සමාජයෙන් ලබා දෙන ආදර්ශ අගය කරයි
- අතීත සමාජයෙන් වර්තමානයට ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි
- කණ්ඩායම් වැඩ සඳහා සහාය වෙයි
- නියමිත කාලය තුළ කාර්ය නිම කරයි

## 7.2 අපේ කීර්තිමත් රජවරු

අනුරාධපුර රාජධානිය පාලනය කළ මානවම්ම රජපෙළපත හා පොළොන්නරුව රාජධානියේ බලයට පත් පළමුවන විජයබාහු, මහා පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල යන රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය හා එයින් ලබා ගත හැකි ආදර්ශ පිළිබඳ ව මෙම ඒකකයෙන් අවධානය යොමු කර ඇත.

**නිපුණතාව** • අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසා බලයි

### 7.2.1 මානවම්ම රජ පෙළපත

**නිපුණතා මට්ටම** **2.1** මානවම්ම රජ පෙළපතේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව** **02**

**ඉගෙනුම් පල**
- මානවම්ම පෙළපතේ රජවරු පිළිබඳ විස්තර කරයි
- මානවම්ම පෙළපතේ රජවරුන්ගෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

2.1 මානවම්ම රජ පෙළපත

- මානවම්ම රජ පෙළපතට පෙර ලම්බකර්ණ හා මෝරිය රජ පෙළපත්වලට අයත් රජවරු අනුරාධපුර රාජධානිය පාලනය කිරිම හා ඔවුන් අතර පැවති ගැටුම්

2.1.1 මානවම්ම රජ පෙළපතේ ආරම්භය

- එ මානවම්ම රජ පෙළපතේ ආරම්භය පිළිබඳ ව පහත සඳහන් කරුණු ඇසුරින් පැහැදිලි කරන්න
- මාන කුමාරුගේ දේශපාලන ක්‍රියාකාරිත්වය හා දකුණු ඉන්දියානු සබඳතා
  - මාන කුමරු දේශපාලනයට අවතීර්ණවන ආකාරය පැහැදිලි කිරීම
    - ★ මාන කුමාරයා රාජ්‍ය බලය අල්ලා ගැනීමට උත්සාහ දැරීම
  - මාන කුමාරයා දකුණු ඉන්දියානු පල්ලව රාජ්‍ය සමග පැවැත්වූ සබඳතාවල ස්වරූපය පැහැදිලි කිරීම
    - ★ දකුණු ඉන්දියානු සබඳතා මාන කුමාරයාට රාජ්‍ය බලය ලබාගැනීමට ඉවහල් වූ ආකාරය පැහැදිලි කිරීම
  - මාන කුමරයා මානවම්ම නමින් අනුරාධපුර රාජධානියේ රාජ්‍යත්වයට පත්වීම
  - මානවම්ම රජතුමාගේ පාලන කාලය

මානවම්ම් රජවරු

- පළමුවන සේන රජතුමාගේ රාජ්‍ය කාලය
  - ★ මෙම කාලයේ ලංකාවට එල්ල වූ පාණ්ඩ්‍ය ආක්‍රමණය
  - ★ ආක්‍රමණිකයන් නිසා විනාශ වූ නගරය ගොඩනැගීමට පළමුවන සේන රජතුමා යළි ක්‍රියා කිරීම
- දෙවන සේන රජතුමාගේ රාජ්‍ය කාලය
  - ★ දෙවන සේන රජතුමා පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීම

ඉහත සඳහන් කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදුකරන්න

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදුකරන්න
- ඇමුණුම 01 හි ඇතුලත් වගුව හුණුපුවරුවේ සටහන් කරන්න
- වගුව අභ්‍යාස පොතේ පිටපත් කර සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දෙන්න
- මානවම්ම චරිතයෙන් ආදර්ශ ගනිමින් සිසු ආකල්ප සංවර්ධනය කරන්න
- මේ සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදාගන්න

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 01 කාර්ය පත්‍රිකාව

ඇමුණුම 01 කාර්ය පත්‍රිකාව

| A - ප්‍රශ්නය | B - පිළිතුර |
|---|---|
| 1. මාන කුමාරයාට පෙර අනුරාධපුරය පාලනය කළ රජතුමා කවු ද? | A.......................................... |
| 2. මාන කුමාරයා සමග සබඳතා පැවැත් වූ දකුණු ඉන්දීය රාජ්‍ය කුමක් ද? | B.......................................... |
| 3. මාන කුමාරයාට සහාය දුන් දකුණු ඉන්දීය පාලකයා කවු ද? | C.......................................... |
| 4. මාන කුමාරයා රාජ්‍ය මධ්‍යස්ථානය පිහිටුවා ගත්තේ කොහේ ද? | D.......................................... |
| 5. රජ වූ පසුව මාන කුමාරයා හැඳින් වූ නම කුමක් ද? | E.......................................... |

- ඉහත A තීරුවේ දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා B තීරුවේ හිස්තැන් පුරවන්න
- (අනුරාධපුරයේ ය, දෙවන නරසිංහවර්මන් රජතුමා, පල්ලව රාජ්‍යයයි, මානවම්ම රජතුමා, හත්ථදාඨ රජතුමා)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සිදුකරන්න

- මානවම්ම රජතුමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- ප්‍රශ්න සඳහා  නිවැරදි පිළිතුරු ලිය යි
- මානවම්ම රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය අගය කරයි
- ගුරු උපදෙස් පිළිපදියි
- නියමිත කාලය තුළ කාර්ය නිම කරයි

**නිපුණතා මට්ටම** **2.1** මානවම්ම රජපෙළපතේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** **02**

**ඉගෙනුම් පල**
- මානවම්ම පෙළපතේ රජවරුන්ගේ පාලන ප්‍රතිපත්ති පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න

2.1.2 රාජ්‍ය පාලන සංවිධානය

I මධ්‍ය පාලනය

II ප්‍රාදේශීය පාලනය

- මධ්‍ය පාලනය සඳහා පත්කළ නිලධාරීන්, ස්වරූපය හා කාර්ය භාරය පැහැදිලි කිරීම
- ප්‍රාදේශීය පාලනය සඳහා පත්කළ නිලධාරීන්, ස්වරූපය හා කාර්ය භාරය පැහැදිලි කිරීම
- විධිමත් පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් රාජ්‍ය ස්ථාවර ව පවත්වා ගැනීමට මානවම්ම රජවරුන්ගෙන් ලබා ගත හැකි ආදර්ශ සාකච්ඡා කිරීම

**ඉහත සඳහන් කරුණු ආවරණයවන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදුකරන්න
- ඇමුණුම 02 හි ඇතුලත් වගුව හුණුපුවරුවේ සටහන් කරන්න
- වගුව අභ්‍යාස පොතේ පිටපත් කර පෙළ පොත ඇසුරින් මානවම්ම් රජවරුන්ගේ පාලන සංවිධානය පිළිබඳ තොරතුරු සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න
- මේ සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න
- සිසු ක්‍රියාකාරකම් ඇගයීම කරන්න

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 02 කාර්ය පත්‍රිකාව

ඇමුණුම 02

| පාලන ක්ෂේත්‍ර | නිලධාරීන් | කාර්යයන් |
|---|---|---|
| මධ්‍ය පාලනය | 1. ..........<br>2. ..........<br>3. ..........<br>4. ..........<br>5. .......... | 1. ..........<br>2. ..........<br>3. ..........<br>4. ..........<br>5. .......... |
| ප්‍රාදේශීය පාලනය | 1. ..........<br>2. ..........<br>3. ..........<br>4. ..........<br>5. .......... | 1. ..........<br>2. ..........<br>3. ..........<br>4. ..........<br>5. .......... |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සකස් කරන්න

- මානවම්ම රජවරුන්ගේ පාලන තන්ත්‍රය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- මානවම්ම රජවරුන්ගේ පාලන ප්‍රතිපත්ති අගයයි
- වගුව නිවැරදි ව සම්පූර්ණ කරයි
- ගුරු උපදෙස් පිළිපදියි
- නියමිත කාලයට නිම කරයි

**නිපුණතා මට්ටම** 2.1 මානවම්ම රජපෙළපතේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 02

**ඉගෙනුම් පල**
- මානවම්ම රජවරුන්ගේ සමාජ සුභසාධන කටයුතු පැහැදිලි කරයි
- මානවම්ම රජවරුන්ගේ විදේශ කටයුතු විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු යටතේ මානවම්ම රජවරුන්ගේ රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ග හා සමාජ සුබසාධන කටයුතු උදාහරණ මගින් පැහැදිලි කරන්න

2.1.3 රාජ්‍ය ප්‍රතිපත්ති හා සමාජ සුභ සාධනය

I. ආරක්ෂාව

II. නීතිය හා සාමය

III. ආර්ථිකය පවත්වා ගැනීම හා වැඩි දියුණු කිරීම

- රාජ්‍යයේ ආරක්ෂාව සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග උදාහරණ මගින් පැහැදිලි කිරිම
  - සේනා සංවිධානය
  - බලකොටු පිහිටුවීම
  - නගර නිර්මාණය

- ජනතාවගේ සුභසිද්ධිය සඳහා නීතිය හා සාමය සුරක්ෂිත කිරීමට ගත් ක්‍රියාමාර්ග
  - පනවන ලද නීති රීති හා ඒවා ක්‍රියාත්මක කළ ආකාරය

    උදා: වර්තමාන මන්නාරම කච්චේරිය අසල තිබූ , වේවැල්කැටිය ශිලා ලිපිය

- රාජ්‍යයේ ආර්ථික සුරක්ෂිතභාවය සඳහා ගත් ක්‍රියාමාර්ග
  - බදු ප්‍රතිපත්තිය
  - මුල්‍ය කළමණාකරණ ප්‍රතිපත්ති

    හතරවන මිහිඳු - මිහින්තලා පුවරුලිපිය
  - රාජකීය දීමනාවල ස්වරූපය පැහැදිලි කිරීම

    අත්තානි ලේඛන

2.1.4 කලාපීය දේශපාලනික ප්‍රවණතා සහ විදේශ ප්‍රතිපත්ති

- මානවම්ම රජවරුන්ගේ විදේශ ප්‍රතිපත්තිය
  - දකුණු ඉන්දියාව සමඟ පැවැත්වූ සබඳතා

**මූලික වදන් / සංකල්ප**

- අත්තානි ලේඛන - ආගමික ආයතනවලට පිරිනමන ලද දීමනා පිළිබඳ ව සඳහන් ලේඛන

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාඩමට අදාළ ව ඉගෙනුම් පල මැනෙන සේ නිර්ණායක සකස් කර ලකුණු පවරන්න

## 2.2 මහා විජයබාහු රජතුමා

**නිපුණතාවය** • කලාපීය වශයෙන් උද්ගතවන දේශපාලන අර්බුද කළමනාකරණය සඳහා දේශීය පාලකයන් ක්‍රියා කළ ආකාරය විමසා බලයි

**නිපුණතා මට්ටම** 2.2.1 අතීත පාලකයෝ දේශයේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** **06**

**ඉගෙනුම් පල**

- පාලකයින් අප්‍රතිහත ධෛර්යයෙන් සිය අරමුණුවලට ළගා වන ආකාරය විස්තර කරයි
- සමාජ ප්‍රගමනය උදෙසා පාලකයින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පැහැදිලි කරයි
- ඉවසීම, තීක්ෂණ ඥානය, පුළුල් දැක්ම, සංවිධාන ශක්තිය ආදී නායකයෙකුගේ චරිතයෙන් පිළිඹිබුවන ගුණාංග පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම ගොඩ නගන්න

**2.2.1 ළමා කාලය හා රජ්‍ය බලය ලබා ගැනීම**

- විජයබාහු රජුගේ දෙමාපියන් සහ පරපුර පිළිබඳ ව සිසුන්ට පැහැදිලි කර දෙන්න
- එතුමා ළමා කාලයේ ගත කළ ජීවිතය පිළිබඳව පහත කරුණු ඔස්සේ සිසුන්ට පැහැදිලි කරන්න
  - ළමා කාලයේ අත්විඳින්නට සිදු වූ අපමණ දුක් ගැහැට පිළිබඳ සැබෑ තොරතුරු රාශියක් එතුමා විසින් ම ලියවන ලද පනා කඩුව තඹ සන්නසේ සඳහන් වීම
  - රජවීමට පෙර මෙතුමා "කිත්ති" කුමරු ලෙස හැඳින්වීම
  - දුක් කම්කටලු වලින් ගහණ කුමරුගේ ළමා කාලය පිළිබඳ තොරතුරු
    - චෝල පාලකයෝ රාජ්‍යයට උරුමකම් කී කුමාරවරුන් සොයමින් මරණයට පත් කිරීම

- චෝලයන් වරින් වර රුහුණුට කඩාවැදී අලාභ හානි කිරීම
  - රුහුණේ සිටි පැරණි පාලකයන් අතර බල අරගල
  - මෙවන් පසුබිමක් තුළ රුහුණේ තැන තැන සැඟවෙමින් වනගත ජීවිතයක් ගත කරමින් ගෙවූ දුෂ්කර ජීවිතය

මේ පිළිබඳ සැබෑ තොරතුරු පනාකඩුව තඹ සන්නසේ සඳහන් වේ

- රුහුණේ සෙන්පතියෙක් වූ බුද්ධරාජ හෙවත් බුදල්නාවන් කුමරුට ආරක්ෂාව සලසවමින් දේශපාලන බලයක් ගොඩ නගා ගැනීමට ආධාර කිරීම
- රුහුණේ පාලකයා වීම
  - ක්‍රි.ව. 1055 දී, කිත්ති කුමරු විජයබාහු නමින් රුහුණේ රාජත්වයට පත් වීම
  - මහානාගහුල පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගැනීම

### 2.2.2 විජයබාහු රජුගේ දේශපාලන ක්‍රියාකාරිත්වය

- **සටන් ව්‍යාපාරය හා එහි පසුබිම**
  - චෝළයන් මෙරටට පැමිණ රජරට අත්පත් කර ගැනීම
  - විජයබාහු රජු විදේශීය පාලනයෙන් රජරට මුදා ගැනීම
  - කිහිපවරක් පරාජයට පත් වූවත්, අධෛර්යට පත්නොවී නැවත සේනා සංවිධානය කිරීම
  - රුහුණේ සිට මාර්ග තුනක් ඔස්සේ සේනාව මෙහෙයවා පොළොන්නරුව විදේශිකයින්ගෙන් නිදහස් කර ගෙන ක්‍රි.ව. 1070 දී එහි බලයට පත් වීම
  - පොළොන්නරුව අගනගරය කර ගෙන ලංකාවේ එක් සේසත් පාලනයක් පිහිටුවීම

- **විදේශ ප්‍රතිපත්තිය**

  ඉන්දියාවේ චෝළ විරෝධි රාජධානි සමග සබඳතා ඇති කර ගැනීම
  - සහෝදරිය වූ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමරෙකුට විවාහ කර දී පාණ්ඩ්‍ය රාජධාණිය සමඟ මිතුරු වීම
  - බටහිර චාලුක්‍යයන් සමග මිත්‍ර සබදතා ඇති කර ගැනීම
  - තිලෝකසුන්දරි නම් කාලිංග බිසව සරණපාවා ගෙන කාලිංග දේශය සමග මිතුරු වීම
  - බුරුමය සමග සබඳතා ගොඩනගා ගැනීම

### 2.2.3 විජයබාහු රජුගේ සමාජ මෙහෙවර

- **ආගමික කටයුතු**
  - බුරුමයෙන් උපසම්පදාව ලැබූ භික්ෂූන් ගෙන්වා ශාසනය නගා සිටුවීම
  - පොළොන්නරුවේ තෙමහල් දළදා මන්දිරය කර වීම
  - අනුරාධපුර හා රුහුණේ වෙහෙර විහාර පිළිසකර කරවීම
  - ශ්‍රී පාදයට පුද සත්කාර කිරීම

- වෙනත් සේවා
  - සම්ප්‍රදායික පරිපාලන තන්ත්‍රය නැවත පිහිටු වීම
  - විනාශයට පත්ව තිබූ වාරිමාර්ග පිළිසකර කරවා ආර්ථිකය සමෘද්ධිමත් කිරීම

**මහා විජයබාහු රජුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ**

- රජ කුමරෙකු ලෙස ඉපදුන ද කුඩා කල සිට අභියෝග රැසකට මුහුණ දීමට සිදු වීම හා අධිෂ්ඨානශීලී ව කටයුතු කර ඒවා ජය ගැනීම
- තමා ළමා කාලයේ දුක් විඳි ආකාරය රජ වූ පසුවත් අව්‍යාජ ලෙස දක්වා තිබීම හා කෘතගුණ සැලකීම (පානකඩුව තඹ සන්නස)
- රජතුමා තුළ පැවති නොපසුබස්නා උත්සාහය
- තම මව්බිම රැකගැනීම පිළිබඳ හැඟීම

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි ද්විත්ව සටහන් ජර්නලයක් සැකසීම**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- පන්තියේ සිසුන් ප්‍රමාණය අනුව කණ්ඩායම් කිහිපයකට බෙදන්න
- ඇමුණුම 01හි සඳහන් ද්විත්ව සටහන් ජර්නලය පන්තියේ ප්‍රදර්ශනය කරන්න
- ඇමුණුම 02හි සඳහන් ද්විත්ව සටහන් ජර්නලය සැකසීමේ උපදෙස් පිළිපදින්න
- කණ්ඩායම්වලට ගුණාත්මක යෙදවුම් (ඩිමයි/පැලැටිග්නම්) ලබා දී එය සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න
- කණ්ඩායම හා එක්ව සාකච්ඡා පවත්වමින් ක්‍රියාකාරකම සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරවන්න
- එම ද්විත්ව සටහන් ජර්නලය තම අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න
- සිසුන් ප්‍රමාණය අඩු පාසල්වල පන්ති කාමර තුළ සියලු සිසුන් සම්බන්ධ කරමින් ඔවුන්ගේ අදහස් ලබා ගෙන ද්විත්ව සටහන් ජර්නලය පිරවීම කළ හැකිය
- මේ සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදාගන්න

**ගුණාත්මක යෙදවුම්**

- ඩිමයි කොළ
- ප්ලැටිග්නම්
- ඇමුණුම 01

ඇමුණුම 01

| මහා විජයබාහු රජු මුහුණ දුන් අභියෝග | එම අභියෝග ජයගත් ආකාරය (සිසු ප්‍රතිචාර) |
|---|---|
| 1. ළමා කාලය<br>2. රුහුණේ බලය ලබා ගැනීම<br>3. චෝළ අධිපත්‍යයෙන් රජරට මුදවා ගැනීම<br>4. පොළොන්නරු නගරය නව අගනගරයක් ලෙස ගොඩ නැංවීම<br>5. බුදු සසුන නගා සිටුවීම | |

ඇමුණුම 02

ද්විත්ව සටහන් ජර්නලය සඳහා උපදෙස්

- ඩිමයි කඩදාසිය තීරු දෙකකට බෙදන්න
- වම්පස තීරුවේ අදාළ මාතෘකාව ලියන්න(ඇමුණුම 01 හි පරිදි)
- දකුණුපස තීරුවේ මාතෘකාවට අදාළ සිසු ප්‍රතිචාරය ලිවීමට උපදෙස් දෙන්න
- ඒ අනුව සියළුම මාතෘකා සඳහා සිසු ප්‍රතිචාර සටහන් කිරීමට උපදෙස් දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් කරුණු ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සකස් කරන්න

- මහා විජයබාහු රජු පිළිබඳ තොරතුරු විස්තර කරයි
- එතුමා පිළිබඳ අභිමානයෙන් කතා කරයි
- එතුමා පිළිබඳ තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරයි
- රජතුමා පිළිබඳ ද්විත්ව සටහන් ජර්නලයක් සකස් කරයි
- ක්‍රියාකරකම සඳහා සහයෝගය දක්වයි

## 2.3 මහා පරාක්‍රමබාහු රජතුමා

**නිපුණතා මට්ටම** 2.3.1 මහා පරාක්‍රමබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය මතුකර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** **05**

**ඉගෙනුම් පල**

- පරාක්‍රමබාහු රජුගේ පෞරුෂය ගොඩ නැගෙන ආකාරය පෙන්වා දෙයි
- පරාක්‍රමබාහු රජුගේ පාලන ප්‍රතිපත්ති සමාජය නගා සිටුවීමට පසුබිම් වූ ආකාරය පැහැදිලි කරයි
- පරාක්‍රමබාහු රජුගේ විදේශ ප්‍රතිපත්ති හා එහි බලපෑම් විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ පාඩම් සැලසුම ගොඩ නගන්න

**2.3.1 පරපුර හා රාජකීය සබඳතාව**

- පරාක්‍රමබාහු කුමරුගේ මව රත්නාවලී දේවියයි. පියා දක්ඛිණ දේශය (මායාරට) පාලනය කළ මනාභරණ කුමරුයි
- විජයබාහු මරණයෙන් පසුව ඇති වූ අභ්‍යන්තර බල අරගල සහ පොළොන්නරුව, දක්ෂිණ දේශය හා රුහුණේ වෙනම රාජධානි ගොඩනැගී තිබූඅයුරු පැහැදිලි කරයි
- පරාක්‍රමබාහු රජුගේ ළමා කාලය
- දක්ඛිණ දේශයේ දැදිගම උපත ලැබීම
- කුඩාකලදී ම පියාගේ අභාවය

**2.3.2 බලය සඳහා කළ අරගල**

- කීර්ති ශ්‍රී මේඝගෙන් පසු ව පරාක්‍රමබාහු කුමරු දක්ඛිණ දේශයේ පාලකයා වීම හා පාලන මුලස්ථානය පරාක්‍රමපුරය (පඬුවස්නුවර) වීම
- රජරට බලය ලබා ගැනීම
- රජරට බලයට පත් වීමෙන් පසු දිවයින එක් සේසත් කිරීම

**2.3.3 ආර්ථික සංවර්ධන කටයුතු**

ප්‍රධාන වාරි ව්‍යාපෘති

- දක්ෂිණ දේශයේ පාලකයා වශයෙන් සිටිය දී සිදු කළ සේවය
- පරාක්‍රම සමුද්‍රය ඇතුළු වැව් හා ඇළමාර්ග රාශියක් ප්‍රතිසංස්කරණය කිරීම
- අහසින් වැටෙන එක් දිය බිඳක්වත් නිකරුණේ මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතුය යන ආදර්ශ පාඨය ඔස්සේ රජු ක්‍රියාකිරීම
- ශ්‍රී ලංකාවේ වාරිකර්මාන්ත හා කෘෂි කර්මික කටයුතුවල විශාල දියුණුවක් ඇති කිරීම පිළිබඳ පැහැදිලි කරන්න

- ශාසන සාමග්‍රිය ඇති කිරීම
  - පරිහානියට පත්ව තිබූ බුදු සසුන නගා සිටුවීම සඳහා කළ සේවය
    - නිකාය භේදය දුරලීම
    - භික්ෂූන් සඳහා විනය නීති සැකසීම
    - පොළොන්නරුවේ නව වෙහෙර විහාර තැනවීම
    - අනුරාධපුරයේ පැරණි විහාරාරාම ප්‍රතිසංස්කරණය කරවීම

**2.3.4. විදේශ ප්‍රතිපත්තිය**

- දකුණු ඉන්දියාව හා බුරුමය සමග ගෙන ගිය සටන් ව්‍යාපාරය හා විදේශ වෙළෙඳ කටයුතු
- පරාක්‍රමබාහු රජුගේ චරිතයෙන් ලබා ගත හැකි ආදර්ශ
  - අභියෝග ජය ගැනීම
  - නායකත්ව ගුණාංග

ඉහත සඳහන් කරුණු ආවරණය වන ලෙස ප්‍රශ්න විචාරාත්මක තරගයක් පැවැත්වීම

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදා මහපැරකුම් රජු පිළිබඳ ව පහත තේමා යටතේ ප්‍රශ්න සකස් කරවන්න
  - මහාපරාක්‍රමබාහු රජුගේ ළමා කාලය
  - රාජ්‍යත්වයට පත් වීම සඳහා සිදු කළ සටන්
  - ඉදිකළ /ප්‍රතිසංස්කරණය කළ වාරිමාර්ග
  - ශාසනික සේවය
- සිසුන් සැකසූ ප්‍රශ්න අතරින් සුදුසු ප්‍රශ්න තෝරා විෂය අන්තර්ගතය ආවරණය වන සේ ප්‍රශ්න එකතුවක් සකස් කරන්න
- සිසු සංඛ්‍යාව අනුව පන්තිය බෙදා ප්‍රශ්න විචාරාත්මක තරගයක් පවත්වන්න
- මේ සඳහා එක් කාලච්ඡේදයක් යොදා ගන්න
- ප්‍රශ්න විචාරාත්මක තරගයක දී පිළිපැදිය යුතු නිති රීති අනුගමනය කරමින් කණ්ඩායම් සඳහා ලකුණු පවරන්න

**ගුණාත්මක යෙදවුම්**

- මහාපරාක්‍රමබාහු රජු පිළිබඳ ව ඇති පොත් පත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- මහා පරාක්‍රමබාහු රජු පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරයි
- එතුමා ඉටු කළ සේවය අගයයි
- මහා පරාක්‍රමබාහු රජු පිළිබඳ ප්‍රශ්න සකස් කරයි
- ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඉදිරිපත් වෙයි
- ජය පරාජය සම ව විඳිමින් සහයෝගයෙන් කටයුතු කරයි

## 2.4 නිශ්ශංකමල්ල රජතුමා

**නිපුණතා මට්ටම** 2.4 නිශ්ශංකමල්ල රජතුමාගේ කාර්යය සාපල්‍ය මතුකර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාවඃ** 03

**ඉගෙනුම් පල**
- පාලකයින්ගේ අනන්‍යතාව තුළ තිබෙන සුවිශේෂිතාව විස්තර කරයි
- නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග ජයගත් ආකාරය මතුකර දක්වයි
- නිශ්ශංකමල්ල චරිතයෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න

2.4 නිශ්ශංකමල්ල රජතුමා

- මහා පරාක්‍රමබාහු රජුගෙන් පසු ව පොළොන්නරුවේ වැදගත් ම පාලකයා නිශ්ශංකමල්ල රජු බව සඳහන් කරමින් එසේ වන්නේ ඇයි දැයි කෙටියෙන් සිසුන්ට පැහැදිලි කරන්න
  - පරාක්‍රමබාහු රජුගෙන් පසු ව රටේ ඇති වූ දේශපාලන අවුල්සහගතභාවය සමනය කිරීම
  - පරාක්‍රමබාහු රජුගෙන් පසු ව පොළොන්නරු යුගය තුළ වසර 9ක් කාලයක් රට පාලනය කල පාලකයා වීම
  - ජනහිතකාමී පාලකයෙකු වීම
  - වැඩි වැඩියෙන් ශිලා ලිපි පිහිටුවා තිබීම
- නිශ්ශංකමල්ල කුමරු ඉන්දියාවේ කාලිංග වංශිකයෙකි. ඔහු නව රාජ වංශයක ආරම්භයක පාලකයා වේ
  - මව - පාර්වතී දේවිය
  - පියා - ශ්‍රී ජයගෝප මහාරාජ
- ලංකාව පුරා පිහිටුවා ඇති ශිලා ලේඛනවලින් මෙතුමා පිළිබඳ තොරතුරු රැසක් ලබා ගත හැකිය
- නිශ්ශංකමල්ල රජුට මුහුණ දීමට සිදුවූ අභියෝග
  - විජාතියෙකු වීම
  - බලවත් දේශීය සේනාධිපතිවරු සිටීම
  - ගොවිකුල වංශිකයන්ගේ තර්ජන
  - කාලිංග - පාණ්ඩ්‍ය බල අරගල
  - ප්‍රත්‍යන්ත ප්‍රදේශවල වැසියන්ගේ විරෝධතා
  - සිහසුනට උරුමකම් කී කුමාරවරුන්ගේ තර්ජන
- එම අභියෝග සාර්ථක ව ජය ගෙන රාජ්‍යත්වයට පත් වීම හා වසර නමයක් සාමකාමීව රට පාලනය කිරීම
- නිශ්ශංකමල්ල රජු සිදුකළ සේවය පහත කරුණු ඔස්සේ කෙටියෙන් පැහැදිලි කරන්න
  - රටේ දේශපාලන ස්ථාවර තත්ත්වයක් ඇති කිරීම
  - වැව් අමුණු ප්‍රතිසංස්කරණය කරමින් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම
  - ජනතාවට බදු සහන ලබා දීම (තුලාභාර දන් දීම)

- බුදු දහමෙහි දියුණුවට කටයුතු කිරීම
  - (i) රන්කොත් වෙහෙර
  - (ii) හැටදා ගෙය ඉදි කිරීම
  - (iii) වෙහෙර විහාර රැසක් ප්‍රතිසංස්කරණය කිරීම

- නිශ්ශංකමල්ල රාජ සභා මණ්ඩපය, සත්මහල් ප්‍රාසාදය වැනි කලා නිර්මාණ කරවීම

- රටපුරා සංචාරය කිරීම
- නිශ්ශංකමල්ල චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ
  - ඉහත සඳහන් විෂය කරුණු ආවරණයවන ලෙස
  - නිශ්ශංකමල්ල රජු පිළිබඳ තොරතුරු ඇතුළත් සංකල්ප රූප සටහනක් පිළියෙළ කිරීමට සිසුන් යොමු කරවන්න
  - සංකල්ප රූප සටහන පිළියෙළ කිරීමේ ක්‍රියාකාරකම සම්බන්ධ ව උපදෙස් ඇමුණුම 01 හා 02හි දක්වා ඇත
  - මේ සඳහා එක් කාලපරිච්ඡේදයක් ලබා දෙන්න
  - ඇමුණුම 03 හි ක්‍රියාකාරකම පසු වැඩ ස1දහා ලබා දෙන්න


**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 01
- ඇමුණුම 02
- ඇමුණුම 03

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- නිශ්ශංකමල්ල රජු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- එතුමා සේවය අගය කරයි
- පිරිසිදුව හා පිළිවෙලට කාර්ය සිදුකරයි
- ක්‍රියාකාරකම සඳහා සහයෝගය දක්වයි
- නියමිත කාලයට නිම කරයි

ඇමුණුම 01




ඇමුණුම 02 - සංකල්ප රූප සටහන සඳහා උපදෙස්

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම 01 හි සඳහන් වගුව පන්තියට ප්‍රදර්ශනය කළ හැකි ආකාරයට පිටපත් කිරීමට උපදෙස් දෙන්න. (අභ්‍යාස පොතේ හෝ වෙනත් කඩදාසියක)
- එක් එක් කොටුවලට අදාළ තොරතුරු කරුණු වශයෙන් ලියා දැක්වීමට උපදෙස් ලබා දෙන්න
- අන් අය සමග සාකච්ඡා කර සහයෝගී ව ක්‍රියාකාරකම සිදුකරන ලෙස දන්වන්න
- කණ්ඩායම්වලට තම ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න

ඇමුණුම 03 - පසු වැඩ සඳහා ක්‍රියාකාරකම - තොරතුරු වගුවක් සකස් කිරීම

| රජතුමා | ළමා කාලය | මුහුණදුන් අභියෝග | පැවැත්වූ සටන් | සිදු කළ සේවා | | |
|---|---|---|---|---|---|---|
| | | | | දේශපාලන | ආර්ථික | ආගමික |
| මහා විජයබාහු | | | | | | |
| මහා පරාක්‍රමබාහු | | | | | | |
| නිශ්ශංකමල්ල | | | | | | |

## 7.3 අපේ සංස්කෘතික උරුමය

ඉතා අභිමානවත් අතීතයකට හිමිකම් කියන අපි සවිමත් ජාතියක උරුමයන්ට හිමිකරුවෝ වෙමු. යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම ලෙස නම් කළ ස්ථාන කිහිපයක් ද අප සතුය. ලෝක ප්‍රජාව ඉදිරියේ අපගේ අනන්‍යතාව රැක ගැනීම සඳහා සහ කුඩා රටක් වුව ද ශ්‍රී ලංකීය ප්‍රෞඪත්වය ලොවට පෙන්වීමට අපේ උරුමය වැදගත් වේ. එම උරුමය හඳුනාගනිමින් එය ආරක්ෂා කිරීමටත්, රැකගැනීමටත් දැනුවත් කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂිතය.

**නිපුණතාව** • ශ්‍රී ලංකාවේ ඉතිහාසයෙන් පිළිබිඹුවන සංස්කෘතික දායාද දේශීය හා ලෝක උරුම ලෙස අගය කරමින් එම දායාද සුරකියි

**නිපුණතා මට්ටම** 3.1 අපේ සංස්කෘතික උරුමය පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 01

**ඉගෙනුම් පල** • සංස්කෘතික උරුමය පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

3.1 අපේ සංස්කෘතික උරුමය හඳුන්වා දීම

- කිසියම් සමාජයක් දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩ ව රැගෙන එන දැනුම හා එහි භාවිතය සංස්කෘතික උරුමය ලෙස හඳුන්වයි

- දැනුම හා එහි භාවිතයේ ස්වරූපය අනුව එක් එක් සමාජවල උරුමය විවිධාකාර වීම
- දැනුම යනු ඒ ඒ සමාජයන්ට ආවේනික සම්ප්‍රදායන් සිරිත් විරිත්, ඇදහිලි හා විශ්වාස, කලා ශිල්ප, කෞතුක වස්තූන්, ජන ගායනා, ජන නැටුම් හා ජනශ්‍රැති ආදිය වේ. මේවා අස්පෘශ්‍ය උරුමය ලෙස සලකනු ලබයි
- අනාදිමත් කාලයක සිට පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූ සමාජ වටිනාකම්ය
- දීර්ඝ කාලීන ශිෂ්ටාචාරයක් පැවති රටක් වශයෙන් වටිනා උරුම රැසක් අප රටට දායක වී ඇති බව පෙන්වා දීම

**භාවිතය යනු :**

එදිනෙදා ජීවිතයේ දී මුහුණු දීමට සිදුවන ප්‍රායෝගික ගැටලු නිරාකරණය කිරීමෙහිලා සම්ප්‍රදාය මගින් උරුම කරන ලද දැනුම භාවිත කිරීම හා එහි ප්‍රතිලාභ අත්විඳීමෙන් ඓතිහාසික උරුමය භාවිත කාලයට එක් කළ හැකි ය. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායට අයත් තවමත් භාවිතවන අත් බෙහෙත්, කෙම් ක්‍රම ආදි දෑ ඊට ඇතුළත් කළ හැකි ය.

**ගුණාත්මක යෙදවුම්**

- අපේ උරුමය පිළිබඳ ලියවුණ පොත්පත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අපේ සංස්කෘතික උරුමය පැහැදිලි කිරීම සඳහා සුදුසු නිර්ණායක යොදා ගනිමින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

**නිපුණතා මට්ටම** 3.1 අපේ සංස්කෘතික උරුමය පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 06**

**ඉගෙනුම් පල**

- ස්පෘශ්‍ය උරුමය විස්තර කරයි
- ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුම නම් කරයි
- ලෝක උරුමයක් වූ සීගිරිය පිළිබඳ විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**3.1.1 ස්පෘශ්‍ය උරුමය**

සංස්කෘතික උරුමය ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය උරුමය ලෙස කොටස් දෙකකි ස්පෘශ්‍ය උරුමය යනු ස්පර්ශ කළ හැකි උරුමයයි. එනම් භෞතික වස්තූන් ලෙස පවත්නා ගොඩනැගිලි, ස්මාරක, පොත්පත්, කලාත්මක කෘතීන් පුරාවිද්‍යාත්මක ස්ථාන, වැව් අමුණු හා විවිධ කෞතුක වස්තූන් ය

- මේවා රටේ අනන්‍යතාව තහවුරු කරන ප්‍රධාන සාධකයන් බව පැහැදිලි කිරීම
- ස්පෘශ්‍ය උරුමයට අයත් ස්මාරක හා පුරාවස්තු රටපුරා ව්‍යාප්ත ව පැවතීම
- දීර්ඝ ඉතිහාසයක් හිමි රටක් වශයෙන් ශ්‍රී ලංකාවට උරුම වූ ජාතික උරුම රැසක් ඇති බව පැහැදිලි කිරීම

**ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුම**

- **ලෝක උරුම යන්න පැහැදිලි කරන්න**
  - ලෝකයේ විවිධ රටවල පිහිටි සුවිශේෂ සංස්කෘතික හා ස්වාභාවික උරුම සමස්ත මානව වර්ගයාටම අයත් පොදු උරුම ලෙස නම් කිරීම
  - යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම හඳුනාගැනීම
  - වර්ෂ 2011 වනවිට ලෝක උරුම 911ක් හඳුනාගෙන තිබීම

ඉන් 704 ක් සංස්කෘතික උරුම වේ. ශ්‍රී ලංකාවෙන් ලෝක උරුම 06ක් නම් කර තිබීම. ඒවා නම්, අනුරාධපුර නගරය පොළොන්නරු නගරය, මහනුවර නගරය, දඹුල්ල රජමහා විහාරය, සීගිරිය හා ගාලු කොටුව යන ඒවා ය.

- ලෝක උරුමයක් වූ සීගිරිය
  - ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයක් වූ සීගිරිය 1982 දී ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කර ඇත.
  - ගල් පර්වතයක් මත විශිෂ්ට වාස්තු විද්‍යාත්මක සැලැස්මක් සහිත ව ඉදිවී ඇති සීගිරිය පැරණි බලකොටුවත් එයට නැගීම සඳහා ඇති පියගැට පෙළ, ගල් පවුර මත අඳිනලද පැරණි බිතුසිතුවම්, කැටපත් පවුර සහ එහි ඉදිකර ඇති මනස්කාන්ත ජල උද්‍යානයත් නිසා ජාතික උරුමයක් වශයෙන් නම් කළ සීගිරිය පසු ව ලෝක උරුමයක් බවට පත්විය.
- සීගිරියේ ගෘහ නිර්මාණ ශිල්පය
  - මුහුදු මට්ටමේ සිට අඩි 1214ක් උසින් කඳු ගැටයක් මත වූ ගල් පර්වතයක් මත එහි මුදුනේ අක්කර 3.5ක පමණ පැතිර ගිය මාලිගය
  - සීගිරිය මුදුනට ඇතුලුවීමට ඇති සිංහකට
- උද්‍යාන
- පොකුණු හා ජල තාක්ෂණය
  - ගල මුදුනේ පිහිටි පොකුණ, ගල පහළ පිහිටි ජල උද්‍යානය හා ජල පවුර, ජලමල්
- කැටපත් පුවර
- ▪ සීගිරි බිතුසිතුවම්

**ඉහත විෂය කරුණු ආවරණය වනසේ සීගිරිය පිළිබඳ පොත් පිංචක් සකස් කිරීම**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- සීගිරිය පිළිබඳ ව තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න
- පින්තූරද ඇතුළත් කරමින් පොත නිර්මාණශීලී ව සැකසීමට උපදෙස් දෙන්න
- පොත් පිංච සැකසීම සඳහා අවශ්‍ය කාලය ලබා දෙන්න (සතියක පමණ)
- ක්‍රියාකාරකම් සඳහා කණ්ඩායම් සියලුදෙනාගේ ම සහාය ගැනීමට කටයුතු කරන්න
- ක්‍රියාකරකම් ඇගයීමට ලක් කරන්න

**ගුණාත්මක යෙදවුම්**

සීගිරිය පිළිබඳ ලියවුණ පොත්පත්, පින්තූර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- සීගිරිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- සීගිරියේ වටිනාකම අගය කරයි
- සීගිරිය ලෝක උරුමයක් වීමට හේතු දක්වයි
- පොත් පිංච නිර්මාණශීලී ව සකස් කරයි
- ක්‍රියාකාරකම් සඳහා සහයෝගය දක්වයි

**නිපුණතා මට්ටම** 3.1 අපේ සංස්කෘතික උරුමය පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 03

**ඉගෙනුම් පල**
- අස්පෘශ්‍ය උරුමය පැහැදිලි කරයි
- අස්පෘශ්‍ය උරුමයක් ලෙස සමාජ චාරිත්‍රවාරිත්‍ර විස්තර කරයි
- අස්පෘශ්‍ය උරුමයක් ලෙස ජන ගීත විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැළසුම් කර ගන්න

**3.1.2 අස්පෘශ්‍ය උරුමය**

- අස්පෘශ්‍ය උරුමය යනු ස්පර්ශ කළ නොහැකි උරුමය වේ. ඒවා පරම්පරාවෙන් පරම්පරාවට ඒ ඒ ප්‍රජාවන් සහ ජන කණ්ඩායම් විසින් අඛණ්ඩව පෝෂණය කරමින් පවත්වා ගෙන එන හා රැක ගෙන එන සංස්කෘතික උරුමය වේ.
- අස්පෘශ්‍ය උරුමය මගින් ඒ ඒ ජන කොට්ඨාශයන්හි අනන්‍යතාව හඳුනා ගත හැකි වීම

  අස්පෘශ්‍ය උරුමය විද්‍යාමාන වන ආකාර (යුනෙස්කෝ ප්‍රඥප්තියට අනුව) පහක් හඳුනාගෙන ඇත. එනම්,
  - ජනවහර හා අදහස් ප්‍රකාශ කිරීම
  - රංග කලාව, ජනකවි සහ ජන සංගීතය
  - සමාජයීය පුරුදු, ඇදහිලි හා උත්සව අවස්ථා
  - ස්වභාව ධර්මය සහ විශ්වීය ආභාසයෙන් ඇති වූ දැනුම හා පුරුදු
  - සම්ප්‍රදායික කලා ශිල්ප

**ඉහත විෂය කරුණු ආවරණය වනසේ තම ජිවිතය හා බැඳි චාරිත්‍ර වාරිත්‍ර හෝ උත්සව අවස්ථාවක් පිළිබඳ තොරතුරු  පන්තියට ඉදිරිපත් කරවන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- සුදුසු පරිදි පන්තිය කණ්ඩායම් කර අපේ ජිවිතයට සම්බන්ධ හෝ උත්සව අවස්ථාවක් තෝරා ගැනීමට උපදෙස් දෙන්න
- එම උත්සවය හෝ අවස්ථාව පිළිබඳ සමාජයේ පිළිගත් චාරිත්‍ර වාරිත්‍ර මොනවාදැයි පන්තිය ඉදිරියේ ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම සාමාජික සියලු දෙනාගේ ම සහයෙන් ඉදිරිපත් කළ යුතු බව දන්වන්න
- ඉදිරිපත් වූ සමාජ චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ සෙසු කණ්ඩායම්වල අදහස් විමසන්න

**ගුණාත්මක යෙදවුම්**

සමාජ චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ ව ඇති පොත්පත්, පින්තූර ආදිය

**ඇගයීම් හා තක්සේරුව සඳහා උපදෙස්**

පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- සමාජ සම්මත චාරිත්‍ර විධි ප්‍රකාශ කරයි
- තෝරා ගත් අවස්ථාවට ගැළපෙන චාරිත්‍ර වාරිත්‍ර පෙන්වා දෙයි
- චාරිත්‍ර වාරිත්‍ර පිළිපැදීම මඟින් අපේ අනන්‍යතාව රැක ගත හැකි අයුරු පෙන්වා දෙයි
- කණ්ඩායමට සහයෝගය දක්වයි
- තොරතුරු ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වෙයි

**නිපුණතා මට්ටම** 3.2 අපේ සංස්කෘතික උරුමය ආරක්ෂා කළ යුතු බව පෙන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** **02**

**ඉගෙනුම් පල**
- ඉපැරණි ඉතිහාසයක් ඇති රටක් ලෙස අපට ජාතික උරුම රැසක් ඇති බව පෙන්වා දෙයි
- ජාතික උරුමය ආරක්‍ෂා කළ යුතු බව පැහැදිලි කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම සැළසුම් කර ගන්න

**3.2 අපේ සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම**

- ඉපැරණි ඉතිහාසයක් ඇති රටක් ලෙස ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම රාශියක් ඇති බව පෙන්වා දීම
  (මෙය අපේ සංස්කෘතික උරුමය හඳුන්වාදීම යටතේ සාකච්ඡා කර ඇත)
- අපේ ආදි මුතුන්මිත්තන් විසින් පරම්පරාවෙන් පරම්පරාවට මෙම උරුම රැක ගෙන ඇති බව පැහැදිලි කිරීම
- අපේ සංස්කෘතික උරුමය රැක ගැනීමේ වටිනාකම
  - අතීත මුතුන්මිත්තන්ගේ සම්ප්‍රදායික දැනුම, ආකල්ප හා අත්දැකීම් මෙම උරුම සමග බැඳී පවතින බැවින් අනාගත පරපුරට ඒවා ලබා ගැනීමට හැකිවීම
  - ගෝලීය සංස්කෘතිය හමුවේ ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්වීමට
  - ශ්‍රී ලාංකික අභිමානය ලෝකයට ප්‍රකාශ කිරීමට
  - ශ්‍රී ලංකාවෙන් බිහි වූ ලෝක උරුම නිසා අපේ ජාතික උරුමය පිළිබඳ ලොව ම දැනුවත් වීම හා ඉන් විදේශ සංචාරක කර්මාන්තයට ද සුභදායී වීම
  - රට පිළිබඳ අභිමානයක්, ඇල්මක් ආදරයක් අනාගත පරපුර තුළ ඇති කිරීමට
- අපේ සංස්කෘතික උරුමය විනාශ කරන්නෝ
  - මෑත කාලයේ නිදන් හෑරීමේ මුවාවෙන් විශාල වශයෙන් පුරා වස්තු විනාශ වීම
  - නිදන් යනු මිත්‍යා මතයක් බව පෙන්වා දීම
- අනාගත පරපුර සඳහා අපේ උරුමය ආරක්ෂා කළ යුතු බව පැහැදිලි කිරීම

**ගුණාත්මක යෙදවුම්**
- අපේ සංස්කෘතිය ආරක්ෂා කිරීම පිළිබඳ ලියවුන පොත්
- විනාශ කළ පුරා විද්‍යාත්මක වටිනාකම් ඇති ස්ථාන පිළිබඳ පින්තූර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අපේ සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීමේ වටිනාකම මතුවන සේ ඇගයීම් හා තක්සේරු නිර්ණායක සකස්කර ගන්න

## 7.4 පසුකාලීන පාලන මධ්‍යස්ථාන

අනුරාධපුරය හා පොළොන්නරුව පාලන මධ්‍යස්ථාන බිඳ වැටීමෙන් පසු ලංකාවේ පාලන මධ්‍යස්ථාන ගොඩනැගීම, ඒවා වෙනස්වීම හා එහි සිටි ශ්‍රේෂ්ඨ පාලකයින් පිළිබඳ තොරතුරු මෙම ඒකකයෙන් සාකච්ඡා කෙරේ.

**නිපුණතාව** 
- ඉන්දියානු සාගර කලාපයේ සමාජ ආර්ථික ප්‍රවනතාවල පරිවර්තනයට සමගාමී ව ශ්‍රී ලංකාවේ සභ්‍යත්වය ඊට අනුකූලනය වූ ආකාරය විමසා බලයි

**නිපුණතා මට්ටම** 4.1 පසුකාලීන දේශපාලන මධ්‍යස්ථානවල තොරතුරු ඉදිරිපත් කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 02

**ඉගෙනුම් පල**
- පසුකාලීන පාලන මධ්‍යස්ථාන හඳුන්වයි
- පාලන මධ්‍යස්ථාන වෙනස්වීමට හේතු දක්වයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න

**7.4** පසු කාලීන පාලන මධ්‍යස්ථාන

- දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පල, කෝට්ටේ සහ යාපනය
- පාලන මධ්‍යස්ථාන වෙනස්වීමට බලපෑ හේතු
  - ආර්ථික හේතු
  - චෝළ රාජ්‍යයේ නැගීම
  - මාඝගේ දරුණු ක්‍රියාකලාපය

පසුකාලීන පාලන මධ්‍යස්ථාන හඳුනා ගැනීම සඳහා සිතියම් ලකුණු කිරීමේ අභ්‍යාසය සිසුන් ලවා කරවන්න

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ගංගා සහිත ලංකා සිතියමක් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න
- පසුකාලීන ව බිහි වූ පාලන මධ්‍යස්ථාන පෙළ පොත ඇසුරින් සිතියමෙහි ලකුණු කිරීමට උපදෙස් දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

ගංගා සහිත ලංකා සිතියම

**ඇගයීම හා තක්සේරුකරණය**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- ස්ථාන නිවැරදි ව නම් කරයි
- ලකුණු කළ ස්ථාන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- පිරිසිදු බව
- නියමිත කාලයේ දී නිම කරයි
- සෙසු අය හා සහයෝගයෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම** 4.1 පසුකාලීන පාලන මධ්‍යස්ථානවල තොරතුරු ඉදිරිපත් කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 08

**ඉගෙනුම් පල** • පාලන මධ්‍යස්ථානවල ශ්‍රේෂ්ඨ පාලකයින් පිළිබඳ විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න

- රජරට පැරණි නගර පරිහානියට පත් වීමෙන් පසු ඇති කර ගත් පාලන මධ්‍යස්ථාන
    - මිනිපේ - සංඛ සෙනෙවි
    - යාපහුව (සුභ පබ්බත) - සුභ සෙනෙවි
    - ගෝවින්ද මලය - බුවනෙකබාහු ආදිපාද
    - දඹදෙණිය - විජයබාහු

- එක් එක් පාලන මධ්‍යස්ථාන යටතේ බිහි වූ ශ්‍රේෂ්ඨ පාලකයින්ගේ කාර්ය අගයමින් කරුණු පැහැදිලි කරන්න

    - දඹදෙණිය
        - තුන්වන විජයබාහු රජතුමා
            - ප්‍රාදේශීය නායකයකු ලෙස නැගී සිටීම
            - මායා රට එක්සත් කර ගැනීම
            - දළදා වහන්සේගේ ආරක්ෂාවට දළදා මැදුරක් ඉදිකිරීම
        - දෙවන පරාක්‍රමබාහු රජතුමා
            - මාඝ පරාජය කිරීම
            - චන්ද්‍රභානු පරාජය කිරීම
            - ශ්‍රේෂ්ඨ පඬිවරයෙකු වීම

    - යාපහුව
        - පළමුවන බුවනෙකබාහු රජතුමා
            - යාපහුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම
            - මිසරය සමග වෙළෙඳ සම්බන්ධතා පැවැත්වීම
            - බෞද්ධ පොත්පත් ලියවීම

- යාපහුවේ දළදා මැදුරක් තැනීම

- කුරුණෑගල
  - හතරවන පරාක්‍රමබාහු රජතුමා
    - කුරුණෑගල දළදා මැදුරක් තැනීම
    - පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම
    - දළදා සිරිත, සිංහල බෝධි වංශය ඇතුලු පොත් පත් කරවීම
    - මහනුවර අස්ගිරි විහාරය හා වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන කරවීම

- ගම්පළ
  - පස්වන බුවනෙකබාහු රජතුමා
    - ලංකාතිලක විහාරය, ගඩලාදෙණිය විහාරය හා ඇම්බැක්කේ දේවාලය ඉදිකිරීම

- කෝට්ටේ
  - හයවන පරාක්‍රමබාහු රජතුමා
    - කෝට්ටේ ආරම්භක පාලකයා වීම
    - වන්නි හා යාපන ප්‍රදේශය යටත් කිරීම
    - ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මැඩලීම
    - ලංකාව අවසන්වරට එක්සේසත් කළ පාලකයා වීම
    - රටේ විශාල ආර්ථික, සංස්කෘතික දියුණුවක් මෙන්ම සාමය උදා වූ කාලයක් වීම

- යාපනය
  - පොළොන්නරුව බිඳ වැටීමෙන් පසු යාපනය ප්‍රාදේශීය රාජ්‍යක් ලෙස නැගී ඒම
  - ආර්ය චක්‍රවර්ති රජවරු
    - විජය කුලංකෛ රජු යාපනය රාජ්‍ය ආරම්භ කිරීම
    - ආර්ය චක්‍රවර්ති රජවරු යටතේ රාජ්‍ය වර්ධනය කිරීම
    - ක්‍රි.ව. 1619 දී පෘතුගිසීන්ට යාපනය රාජ්‍යය යටත් වීම

**ඉහත විෂය අන්තර්ගතය ආවරණය වන පරිදි ප්‍රහේලිකාව පිරවීමට සිසුන්ට උපදෙස් දෙන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- පෙළ පොත ආධාර කරගනිමින් ඇමුණුම 01හි ප්‍රහේලිකාව ඇමුණුම 02හි උපකාරක පද යොදා ගනිමින් සම්පූර්ණ කරවන්න
- ක්‍රියාකාරකම අවසානයේ පිළිතුරු ඇමුණුම 03හි පිළිතුරු සාකච්ඡා කරන්න

**ගුණාත්මක යෙදවුම්**

ඇමුණුම 01

ඇමුණුම 02

ඇමුණුම 03 පිළිතුරු

**ඇගයීම හා තක්සේරුකරණය**

පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න

- රාජධානිවල ශ්‍රේෂ්ඨ රජවරු නම් කරයි
- නිවැරදි ව වගුව සම්පූර්ණ කරයි
- රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය අගය කරයි
- සහයෝගයෙන් ක්‍රියාකරයි
- නියමිත කාලයට නිම කරයි

ඇමුණුම 02

උපකාරක පද

**පහළට**

01. කන්ද යන අරුත් දෙයි
02. කෘෂිකර්මය සඳහා අත්‍යවශ්‍ය දෙයකි
03. කුරුණෑගල හඳුන්වන තවත් නමකි
05. දකුණු ඉන්දියානු රජ පෙළපතකි
06. උතුරේ පිහිටි ප්‍රධාන පාලන මධ්‍යස්ථානය
08 . ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ දේවාලයකි
09. ශ්‍රී ලංකාව සමග වෙළෙඳ සම්බන්ධතා පැවැත්වූ රටකි
12 . රුහුණු,පිහිටි,මායා පාලන ප්‍රදේශ හැඳින්වූයේ මේ නමිනි
14 . ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රාදේශීය බල මධ්‍යස්ථානයකි
15. රජරට ප්‍රදේශය ආක්‍රමණය කළ දකුණු ඉන්දීය රාජ්‍යයකි

**හරහට**

04. ගම්පොළ යුගයට අයත් විහාරයකි
07. කුරුණෑගල රාජධානියට පසු බිහිවූ රාජධානිය
10 . ජෝතිය සිටානන්ගේ කැරැල්ල මැඩපැවැත්වූයේ මොහු විසිනි
11 . නගරය යන අරුත දේ
13 . ශ්‍රී ලංකාවේ පැරණි ප්‍රදේශ බෙදීමකි
16 . පළමුවන බුවනෙකබාහු රජතුමාගේ පාලන මධ්‍යස්ථානයයි
17 . පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කළේ මෙම යුගයේය

**ඇමුණුම 03**

පිළිතුරු

පහළට

1. මලය 2. ජලය 3. ඇතුගල්පුර 5. කාලිංගය 6. යාපනය

8. ඇම්බැක්ක 9. මිසරය 12. රට 14. මායා 15. චෝළ

හරහට

4. ලංකාතිලක 7. ගම්පොළ 10. අම්බුලුගල

13. රජරට 16. යාපහුව 17. කුරුණෑගල

## 7.5 පැරණි ශිෂ්ටාචාර - 02
## යුරෝපයේ පැරණි ශිෂ්ටාචාර

ලෝකයේ පැරණි ශිෂ්ටාචාර කිහිපයක් පිළිබඳ හය ශ්‍රේණියේ දී අවධානය යොමු කර තිබුණි. එම ශිෂ්ටාචාර බොහෝ විට කාලයක් යටපත් වී තිබී මෑත කාලයේ පුරාවිද්‍යා කැනීම්වලින් සොයා ගත් ඒවා වේ. ආසියාවේ පැරණි ශිෂ්ටාචාර බොහොමයක් සාහිත්‍ය ලෝකයෙන් ඈත් ව තිබී සොයාගත් ඒවා වන නමුත් මෙහිදී ඔබට ඉගෙනීමට ලැබෙන ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර සාහිත්‍ය ලෝකයෙන් ඈත් නොවූ පැරණි සභ්‍යත්ව දෙකකි. නූතන යුරෝපා ජන ජීවිතය හා ඉතිහාසය ගොඩනැගීමට මෙන් ම මිනිස් සංහතියේ ඉදිරි ගමනට මෙම ශිෂ්ටාචාරවලින් ප්‍රබල පිටිවහලක් ලැබුණි.

**නිපුණතාව** • මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි

**නිපුණතා මට්ටම** 5.1 පැරණි ශිෂ්ටාචාර පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 04

**ඉගෙනුම් පල**
- ග්‍රීක ශිෂ්ටාචාරයේ පිහිටීම හඳුනා ගනියි
- ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි
- ග්‍රීක ශිෂ්ටාචාරයේ ස්වරූපය පැහැදිලි කරයි
- ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

5. යුරෝපයේ පැරණි ශිෂ්ටාචාර

5.1 ග්‍රීසිය

ග්‍රීසියේ පිහිටීම

බටහිරින් අයෝනියානු මුහුදටත් නැගෙනහිරින් ඊජියන් මුහුදටත් මැදි ව මධ්‍යධරණී මුහුදට නෙරා ඇති අර්ධද්වීපය සහ ඊට දකුණින් ඇති ක්‍රීට දිවයින ඇතුලු දූපත් සමූහය පුරාණ ග්‍රීසියට අයත් වේ.

- දූපත් අතරින් ක්‍රීට දිවයින විශාලතම එක වීම
- ග්‍රීසියට අයත් වෙරළ, වරායවල් ගණනාවකින් සමන්විත වීම
- අලංකාර ඔලිම්පස් කන්ද ඇතුලු කඳු වැටි ගණනාවක් ග්‍රීසිය තුළ පිහිටා තිබීම
- සෞම්‍ය දේශගුණයක් ඇති ග්‍රීසිය සත්ත්ව පාලනය හා කෘෂිකර්මාන්තයට යෝග්‍ය පරිසරයක් තිබීම
- මෙම කරුණු ඇසුරින් ග්‍රීසියේ බාහිර හා අභ්‍යන්තර පිහිටීම සිසුන් සමග සාකච්ඡා කරන්න
- ලෝක සිතියමක ග්‍රීසියේ පිහිටීම පෙන්වා දෙන්න
- ග්‍රීසියේ සිතියම පිටපත් කර ගැනීමට සලස්වා ප්‍රධාන නගර වූ ස්පාටා, ඇතැන්ස්, ට්‍රෝයි, කොරින්ත්, ක්‍රීට දිවයින, අයෝනියානු හා ඊජියන් මුහුද, ඔලිම්පස් කන්ද යන ස්ථාන ලකුණු කිරීමට උපදෙස් දෙන්න

**ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය :**

- ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය ක්‍රි.පූ. 2000 තරම් ඈත කාලයේ සිදු විය
- ග්‍රීසිය ජනාවාස වීම ක්‍රීට දිවයිනේ වැසියන්ගෙන් හා ඉන්දු යුරෝපීය වැසියන්ගෙන් සිදු වීම
- ග්‍රීක ශිෂ්ටාචාරය ආරම්භවීමට පෙර ක්‍රීට දිවයිනේ ඉතා දියුණු ශිෂ්ටාචාර පැවැතීම
    - මිනෝවන් හා මයිසීනියන්
        - මයිසීනියන්වරු ග්‍රීක භාෂාව කතා කරන්නට ඇති බව
        - (ග්‍රීසියේ පිහිටීම/කඳුවැටි හා මිටියාවත්) නිසා ප්‍රධාන ගොඩබිම කොටස් ගණනාවකට බෙදී පැවතීම
        - ගෝත්‍ර වශයෙන් ග්‍රීසියට සංක්‍රමණය වූවෝ ඒවායෙහි පදිංචි වීම
        - ගෝත්‍ර, ගම් වශයෙන් පදිංචි වූවන්ගෙන් ක්‍රමයෙන් නගර බිහිවීම
        - ක්‍රි.පූ. 700 පමණවන විට ග්‍රීසියේ නගර රාජ්‍ය ගණනාවක් බිහිවීම
        - ඇතැන්ස් හා ස්පාටා ඉන් ප්‍රධාන නගර දෙකකි
        - ග්‍රීසියේ ස්වර්ණමය යුගය
        - මහා ඇලෙක්සැන්ඩර් ග්‍රීසිය යටත්කර ගැනීම හා අවසානය

**ග්‍රීක ශිෂ්ටාචාරයේ ස්වරූපය**

- **පාලනය**
    - පෞර රාජ්‍ය ක්‍රමය
- **ජන ජීවිතය**
    - ප්‍රභූන්, සාමාන්‍ය වැසියන්, වහලුන්
    - විනෝදය
    - ඇඳුම් පැළඳුම්
    - රුකියා කලාව හා ගෘහනිර්මාණ
    - ගොඩනැගිලි
    - මූර්ති හා ප්‍රතිමා
    - අලංකාර බඳුන්
    - චිත්‍ර

- සාහිත්‍ය
    - නාට්‍ය කලාව
    - සාහිත්‍ය කෘති

- ක්‍රීඩා
    - ඔලිම්පික් ක්‍රීඩාව
    - ක්‍රීඩාංගන

- අධ්‍යාපනය හා දර්ශනය

**ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද**

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
- ක්‍රීඩා
- නාට්‍ය හා රංග කලාව
- අධ්‍යාපනය
- දාර්ශනික මත
- ගෘහ නිර්මාණ ශිල්පය
- සාහිත්‍ය කෘති

**ඉහත විෂය අන්තර්ගතය ඇසුරින් ග්‍රීක ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු ඇතුලත් පොතක් සකස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- ඇමුණුම 01හි කාර්ය පත්‍රිකාව කණ්ඩායම්වලට ලබා දෙන්න
- කාර්ය පත්‍රිකාවට අනුව පොත සකස් කිරීමට උපදෙස් දෙන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න
- එක් එක් කණ්ඩායම් විසින් නිර්මාණය කරන ලද පොත් සෙසු කණ්ඩායම්වලට ද කියවීමට සලස්වන්න

**ඇගයීම හා තක්සේරුකරණය**

පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- ග්‍රීක ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- ග්‍රීක ශිෂ්ටාචාරයෙන් උරුම වූ දායාද පෙන්වා දෙයි
- ග්‍රීක ශිෂ්ටාචාරයේ දියුණුව අගය කරයි
- නිර්මාණශීලී ව පොත සකසයි
- ක්‍රියාකාරකම සඳහා දායක වෙයි

**ගුණාත්මක යෙදවුම්**

- ග්‍රීක ශිෂ්ටාචාරයට අයත් පින්තූර
- ඇමුණුම 01 කාර්ය පත්‍රිකාව

- පහත මාතෘකා යටතේ ග්‍රීක ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු සොයා පොතක් සකස් කරන්න.
  - ආරම්භය හා වර්ධනය
  - ස්වරූපය
  - ලෝකයට උරුම වූ දායාද
- මෙම මාතෘකාවලට අදාළ පින්තූර එක්කරමින් පොත වඩාත් නිර්මාණශීලී ව සකස් කරන්න
- කණ්ඩායමේ සියලු දෙනාගේ ම සහය ලබා ගන්න
- නියමිත කාලයේ දී පොතෙහි වැඩ අවසන් කර ගුරුතුමා/තුමියට භාර දෙන්න

**නිපුණතා මට්ටම** 5.1 ලෝකයේ පැරණි ශිෂ්ටාචාර පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව: 04**

**ඉගෙනුම් පල**
- රෝම ශිෂ්ටාචාරයේ පිහිටීම හඳුනා ගනියි
- පැරණි රෝම සභ්‍යත්වය පැහැදිලි කරයි
- රෝම ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද විස්තර කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**5.2 රෝමය**

රෝමයේ පිහිටීම

- මධ්‍යධරණී මුහුදුට නෙරා ගිය ඉතාලි අර්ධද්වීපයේ ටයිබර් ගංගාවේ මුවදොරට මදක් ඈතින් ගංගාවේ වම් ඉවුරේ රෝමය පිහිටා ඇත.
- ඇල්ප්ස් හා ඇපිනයින් කඳු වැටිවල පිහිටීම හා බලපෑම
- ටයිබර් ගංගාව හා රෝම නගරයේ පිහිටීමේ වැදගත්කම

- ඉහත විෂය කරුණු ඇසුරින් රෝම නගරයේ පිහිටීම හඳුන්වා දෙන්න
- ලෝක සිතියමේ රෝමය පිහිටීම, ඉතාලියේ පිහිටීම පෙන්වා දෙන්න
- රෝම ශිෂ්ටාචාරය ව්‍යාප්ත වූ ප්‍රදේශ සිතියම පිටපත් කර ගෙන පහත ස්ථාන ලකුණු කරවන්න

  රෝම නගරය, ඇල්ප්ස් කඳු, ඇපිනියන් කඳු, ටයිබර් ගංගාව, මධ්‍යධරණී මුහුද, ග්‍රීසිය, පොම්පේ නගරය, ආඩ්‍රියාතික් මුහුද

- **රෝම ශිෂ්ටාචාරයේ ආරම්භය**
  - රෝමය පිළිබඳ ජන ප්‍රවාද
  - රෙමියුලස් හා රීම්ස්
- ඉතාලියට පැමිණි ජන කණ්ඩායම් හා ඔවුන්ගේ පදිංචි වීම
- රෝම නගරය බිහිවීම
- අධිරාජ්‍යයක් ගොඩනැගීම

- **රෝම ශිෂ්ටාචාරයේ ස්වරූපය**
  - පාලනය
    - සමූහාණ්ඩු
    - අධිරාජ්‍ය පාලනය
  - ජනජීවිතය
    - පවුල
    - ප්‍රභූන්, සාමාන්‍ය මිනිසුන් හා වහලුන්
    - නිවාස, ඇඳුම් පැලඳුම්
    - රැකියා
    - ක්‍රීඩා
    - නීතිගරුක බව

- රෝම නීතිය
- ඉංජිනේරු ශිල්පය හා ගෘහ නිර්මාණ
  - මංමාවත්
  - පාලම්
  - ජල නල මාර්ග හා නාන තටාක
  - නගර නිර්මාණය
  - ගෘහ නිර්මාණය
- කලාව
- අධ්‍යාපනය හා සාහිත්‍යය
- වෙළෙඳාම
- සෞඛ්‍ය හා සනීපාරක්ෂාව
- රෝම ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද
  - ක්‍රිස්තියානි ආගම
  - රෝම නීතිය
  - ඉංජිනේරු ශිල්පය
  - ගෘහ නිර්මාණ
  - දින දර්ශනය
  - ප්‍රස්ථාර ක්‍රමය
  - අධිරාජ්‍ය හා අධිරාජ්‍ය පාලනය

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ සිසුන්ගේ තොරතුරු විමසමින් සාකච්ඡාවක් මෙහෙය වන්න**

- පන්තියේ සියලු ම සිසුන් මේ සඳහා සහභාගී කරගන්න
- සියලු ම සිසුන්ට පෙළපොතේ රෝම ශිෂ්ටාචාරය පාඩම කියවා ගැනීමට කාලය ලබා දෙන්න
- ඉන්පසු රෝම ශිෂ්ටාචාරය පිළිබඳ පාඩමෙන් තමන් කැමති හා අකමැති දේ පිළිබඳ විමසීමක් කරන්න
- සෑම සිසුවෙකුට ම තොරතුරු පැවසීමට අවස්ථාව ලබා දෙන්න
- සිසුන් පවසන තොරතුරුවලට අදාළ මාතෘකාව හුණුපුවරුවේ සටහන් කර ගන්න උදා : ගෘහ නිර්මාණ, නීතිය, ආගම, පාලනය ආදි
- සිසුන්ගෙන් ගිලිහෙන කොටස් ගුරුතුමිය/තුමා මතක් කරමින් ඊට අදාළ සිසු ප්‍රතිචාර ලබා ගන්න
- මෙසේ සිසු සාකච්ඡාවලට සෙසු අයගේ ද සහය ලබා ගෙන ඌන පූර්ණය කරමින් පාඩම ආවරණය වන පරිදි සාකච්ඡාව මෙහෙය වන්න
- පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කාලය වෙන්කර ගන්න
- පාඩම අවසානයේ දී සෑම සිසුවෙකුට ම පසු වැඩක් ලෙස රෝම ශිෂ්ටාචාරය පිළිබඳ රචනාවක් ලිවීමට උපදෙස් දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

රෝම ශිෂ්ටාචාරයට අදාළ පින්තූර

**ඇගයීම හා තක්සේරුකරණය**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

- රෝම ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු පවසයි
- රෝම ශිෂ්ටාචාරය පිළිබඳ රචනාවක් ලියයි
- රෝම ශිෂ්ටාචාරයෙන් ලෝකයට ලැබූ දායාද පෙන්වා දෙයි
- රෝම ශිෂ්ටාචාරයේ විශිෂ්ටත්වය අගය කරයි
- සාකච්ඡාවට දායක වෙයි

| | |
|---|---|
| **පරිගණක පිටු සැකැස්ම** | නිලංකා දිල්හානි රාජසේකර |
| **පිටකවර නිර්මාණය** | ඒ.එල්.සන්ධ්‍යා අතපත්තු<br>කළමනාකරණ සහකාර<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| **විවිධ සහය** | ජී.එස්.බී. ප්‍රනාන්දු<br>කාර්යාල ආධාරක |